# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

අප්‍රේල් 1 - ජූනි 30, 2019




ලේඛක ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගැනීම සහ මාස තුනකට කිට්ටු කාලයක් තිස්සේ ඇප ලබා නොදී රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් විරෝධතාවයක් ජූනි 17 කොළඹ දී පැවැත්වුනි. - *ඡායාරූප අනුග්‍රහය* - madyawediya.lk

INFORM
Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com informcolombo@gmail.com

ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය අප්‍රේල් 1– 2019 ජුනි 31

© ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය, 2019

කොළඹ, ශ්‍රී ලංකාව

# ආවරණය කළ මාතෘකා

- **A.** **එක් රැස්වීමේ සහ සංවිධානය වීමේ නිදහස**
- **B.** **ප්‍රකාශනයේ නිදහස**
- **C.** **මර්දනකාරී නීති**
- **D.** **වෙනත්**

*ඉන්ෆෝම් 1990 වසරේ දී පිහිටුවන ලද්දේ විශේෂයෙන් යුද්ධය සහ අර්බුද පිළිබඳ සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය අධීක්ෂණය හා ලේඛන ගත කිරීමට සහ තත්වය පිළිබඳ ලිඛිත හා වාචික මැදිහත් වීම් හරහා දේශීය, ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් වාර්තා කිරීමටය. ඉන්ෆෝම් එසේම අයිතිවාසිකම් ක්‍රමානුකූල ලෙස සහ නිතර කඩකිරීම්වලට ලක් වෙන ප්‍රජාවන් සමග වැඩ කිරීමට ද මූලික අවධානය යොමු කරයි. වර්තමානයේ ඉන්ෆෝම් ඡන්ද අධීක්ෂණය, ප්‍රකාශනයේ නිදහස මානව හිමිකම් ක්‍රියාධරයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මූලික ලෙස වැඩ කරයි. ඉන්ෆෝම් කොළඹ පිහිටා ඇති අතර, එය දේශිය ක්‍රියාකාරීන්, කණ්ඩායම් සහ ජාල සමග මෙන්ම කලාපීය (ආසියානු) සහ අන්තර්ජාතික මානව හිමිකම් ජාල සමග ද කිට්ටුවෙන් කටයුතු කරයි.*

# පටුන


I. ක්‍රමවේදය ....3
II. සිද්ධිවල ආවරණය ....4
III. විධායක සාරාංශය ....7
IV. සිදුවීම් ලැයිස්තුව ....10
A. එක් රැස්වීමේ සහ සංවිධානය වීමේ නිදහස ....14
1. මැයි 18 වනදා මළවුන් සැමරූ යාපනයේ විශ්වවිද්‍යාල සිසුන්ට තර්ජන ....14
2. කොළඹ අභිමානය (Colombo Pride) උළෙල අභියෝග මැද පැවැත්වේ. ....14
3. උද්ඝෝෂණය කල සිව්දෙනෙක් අත්අඩංගුවට ....15
4. වවුනියාවේ අතුරුදහන් වූවන් පිළිබඳ ක්‍රියාකාරිකයෙකුගෙන් ප්‍රශ්න කෙරේ ....16
5. මන්නාරමේ සිවිල් සංවිධානයක් හමුදාවේ වැටලීමකට ....16
B. ප්‍රකාශනයේ නිදහස ....17
7. වෙසක් සැරසිලි රූප ගත කළ තරුණයින් තිදෙනෙකු අත් අඩංගුවට ....17
8. යාපනයේ පොලිසිය කලු කොඩි එසවීම තහනම් කරයි ....17
9. මුලතිව්හි දමිළ මාධ්‍යවේදියකුට පොලිසියෙන් ප්‍රහාර ....18
10. පුලිට්සර් ත්‍යාගය දිනූ රොයිටර් මාධ්‍යවේදියා රිමාන්ඩ් භාරයට ....19
11. මුලතිව්හී ටැමිල් ගාර්ඩියන් මාධ්‍යවේදියා අත් අඩංගුවට ....19
12. මාධ්‍යවේදී මොහොමඩ් රිෂ්වි මහරූෆ් අත් අඩංගුවට. ....20
13. තිනකරන් පුවත්පතේ ජනමාධ්‍යවේදියකු අත්අඩංගුවට ....21
14. බීබීසී මාධ්‍යවේදී අසාම් අමීන්ට එරෙහිව සමාජ මාධ්‍ය තුළ වෛරී ප්‍රකාශ ....22
15. නිළි දීපානි ද සිල්වාට එරෙහිව වෛරී ප්‍රකාශ ....22
16. ආගමට අපහාස කළැයි මාධ්‍ය ආයතන සභාපතිට නඩු, ලේඛකයාගෙන් ප්‍රශ්න කෙරේ ....23
17. ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගැනීම ....24
18. මාධ්‍යවේදී කුසල් පෙරේරා අත්අඩංගුවට ගැනීමට උත්සාහයක් ....25
C. මර්දනකාරී නීති ....27
19. ICCPR පනත ප්‍රකාශනයේ නිදහස මර්දනයට යොදා ගැනීම. ....27
20. හදිසි නීතිය පැනවීම සහ අයිතිවාසිකම් සීමා වීම ....27
21. ප්‍රතිත්‍රස්ත පනත නැවත ගෙන ඒමේ උත්සාහයක් ....28
D. වෙනත් ....29
22. යාපනය විශ්ව වි.වි. ශිෂ්‍ය සංගමයේ සභාපති, ලේකම් පොලිස් අත්අඩංගුවට ....29
23. මහානායක හිමිගේ වෛරී ප්‍රකාශ ගැන පැමිණිලි කළා යැයි සිවිල් ක්‍රියාකාරිකයාට එරෙහි පලිගැනීම් ....29
24. වාර්ගිකව පක්ෂපාතී ලෙස පරීක්ෂණ නොකැළැයි පොලිස් නිලධාරියාට පා.ම. හිමිනමකගෙන් උසාවියේ දී තර්ජන ....31
25. සරණාගතයන්, සහ සරණාගතයන්ට සහාය දෙන මානව හිමිකම් ක්‍රියාධරයන් සහ සංවිධාන මුහුණ පෑ ගැටළු ....31

## I. ක්‍රමවේදය

මේ වාර්තාව විසින් 2019 අප්‍රේල් 1 - ජුනි 30 කාලයේ දී ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය සම්බන්ධයෙන් සාමාන්‍ය රටාවන් සහ සුවිශේෂී සිදුවීම් ගැන විස්තර සපයයි. මෙම වාර්තාව ප්‍රධාන වශයෙන් ප්‍රධාන ධාරාවේ මාධ්‍යවලින් සහ සමාජ මාධ්‍ය හරහා ලබා ගත් තොරතුරු මත පදනම් වන අතර, සිද්ධි කිහිපයක දී ඉන්ෆෝම් කාර්ය මණ්ඩලය විසින් සිදුවීම්වලට මුහුණ පෑ අය සහ සංවිධාන සමග සිදු කළ සාකච්ඡා හරහා ලබා ගත් තොරතුරු ද අඩංගු වේ. මෙම වාර්තාවේ අඩංගුව වෙන විසම්මුතිය මර්දනය කිරීමේ සිද්ධි අතරට අත්අඩංගුවට ගැනීම්, මානව හිමිකම් ක්‍රියාධරයන් පිළිබඳ ආරක්ෂක අංශ විසින් පරීක්ෂණ සිදු කිරීම් වැනි සිදු වූ සිද්ධි මෙන්ම, මර්දනකාරී නීති වැනි මානව හිමිකම් ක්‍රියාධරයන්ගේ නිදහස සහ ආරක්ෂාවට අනාගතයේ බලපෑ හැකි විය හැකි තර්ජනයන් ද අඩංගු වේ.

මේ වාර්තාවේ, "විසම්මුතිය" යන්න පුළුල්ව අර්ථ දක්වා ඇති අතර ඊට විරෝධතා, ප්‍රතිවිරෝධය, අකීකරු වීම, විරුද්ධව අභියෝග කිරීම, හෝ හිමිකම් කඩවීම් වාර්තා කිරීමට දක්වන උත්සාහයක්, පොලිසිය, සන්නද්ධ හමුදා, ආගමික කණ්ඩායම්, දේශපාලනඥයන් සහ අනෙකුත් අය ඇතුළුව රජයෙන් හෝ රාජ්‍ය නොවන යාන්ත්‍රණයක් මගින් සිදුවන සමාජ අසාධාරණයන් මීට අඩංගු වේ. "මර්දනය යන්න අර්ථ දැක්වෙන්නේ ඉහත රාජ්‍ය හෝ රාජ්‍ය නොවන කාරකයන් මගින් ඉහත සඳහන් විසම්මුතික ක්‍රියාවන් මර්දනය කිරීමට කටයුතු කිරීමයි. එසේම මානව හිමිකම් හෙළා දකිමින් සිදු කරන ප්‍රකාශ ද විසම්මුතිය මර්දනය ලෙස සලකන ලද්දේ ඒවා අයිතිවාසිකම් සෝදා පාළුවට ලක්වීමට දායක වීමට හැකි බැවිනි.

සිද්ධි ආවරණය කොටස යටතේ සිදුවීම්වල භූගෝලීය පැතිරීම, බලපෑමට ලක් වූ අයගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ මර්දනයේ ආකාර, සහ බලපෑම්වලට ලක් වූ අයත් වන ක්ෂේත්‍රයෙන් ආදිය සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක විශ්ලේෂණයක් සපයා ඇත. විධායක සාරාංශයෙන් සන්දර්භය විස්තර කෙරෙන අතර, රටාවන් විශ්ලේෂණය කර, රජයේ සහ වෙනත් පාර්ශවවල චර්යාව ගැන පොදු සොයා ගැනීම් ඉදිරිපත් කරයි. ඉන්ෆෝම් විසින් මාධ්‍ය වාර්තා, සමාජ මාධ්‍ය සහ ඉන්ෆෝම් වෙත වාර්තා වෙන සිද්ධි සහ ඉන්ෆෝම් කාර්ය මණ්ඩලයේ අත්දැකීම් සහ නිරීක්ෂණ අඩංගු වන සිද්ධි පිළිබඳ ලැයිස්තුවක් පවත්වා ගෙන යයි.

## II. සිද්ධිවල ආවරණය




රූපය 1 – සිද්ධිවල භූගෝලීය පැතිරීම

මෙම වාර්තාවේ ඇති සිද්ධි භූගෝලීයව විසිරී ඇති ආකාරය බලන කල පෙනෙන්නේ සිද්ධිවලින් එක් දිස්ත්‍රික්කයකින් වාර්තා වී ඇති ඉහළම සිද්ධි ප්‍රතිශතය වන 32%ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. තවත් 32%ක් උතුරු නැගෙනහිර පළාත්වලිනි. ඒ අතරට යාපනයෙන් සිද්ධි 3 ක්ද, මන්නාරමෙන්, වවුනියාවෙන්, සහ මඩකලපුවෙන් එක් සිද්ධිය බැගින් සිද්ධි 3ක් ද, මුලතිවු වෙතින් සිද්ධි 2ක් ද වාර්තා වේ. අනෙකුත් දිස්ත්‍රික්කවලින් වාර්තා වෙන්නේ සිද්ධි 20%ක් පමණි. මේ අතරට ගම්පහ දිස්ත්‍රික්කයෙන් සිද්ධි 2ක් ද, රත්නපුර, අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් එක් සිද්ධිය බැගින් ද අඩංගු වේ. එක් සිද්ධියක දී සිද්ධිය සිදු වූ දිස්ත්‍රික්කය සොයා ගත නොහැකි වූ අතර, මර්දනකාරී නීති සම්බන්ධ සිද්ධි රටේ සෑම ප්‍රදේශයකටම බලපාන බැවින් ඒවායේ ප්‍රදේශය අදාළ නොවන ලෙස සලකන ලදී. පෙර මාස 3 කාල වකවානු සමග සසඳා බලන කල, මෙම කාල වකවානුවේ උතුරු නැගෙනහිරින් පිටත සිදුවන සිද්ධිවල සැලකිය යුතු වැඩි වීමක් දැක ගත හැකිය.

විවිධ සිදුවීම් 25ක් අතරින්, පැහැදිලිව කාන්තාවන් සම්බන්ධයෙන් පමණක් තිබුනේ සිද්ධි එකක් පමණි. සිදුවීම් 12ක් පිරිමින් සම්බන්ධයෙන් වූ අතර, අනෙකුත් සිද්ධිවල ගැහැණු පිරිමිභාවය සඳහන් වූ තිබුනේ නැති හෝ එය අදාළ නොවූයේ ඒවා කණ්ඩායම්, සංවිධාන වැනි පාර්ශ්වවලට බලපෑ බැවිනි.




රූපය 2 – මර්දනයන් වර්ග කිරීම් අනුව

ඒ අතරම මෙම සිද්ධිවලින් බහුතරය එනම් 32%ක් විසංවාදීන් අත්අඩංගුවට ගැනීම් වේ. 16%ක් සිද්ධි පොලිසියෙන් සහ ආරක්ෂක අංශ විසින් දැනට සිදුවෙන පරීක්ෂණ සහ ප්‍රශ්න කිරීම් සම්බන්ධයෙනි. 12%ක් වාචික තර්ජන වේ. 8%ක් මානව හිමිකම් ආයතන පරීක්ෂා කිරීමට හා වැටලීමට ලක් කිරීම සම්බන්ධයෙනි. තවත් 8%ක් වෛරී ප්‍රකාශයන්ට සම්බන්ධ සිද්ධි විය. 12%ක් සිද්ධි මර්දනකාරී නීති සම්බන්ධයෙන් විය. තවත් එක් සිද්ධියක් (4%) කායික පහර දීමක් සම්බන්ධ එකක් විය.




රූපය 3- වින්දිතයන් වර්ග කිරීම් අනුව

සිද්ධිවලින් බහුතරයක් එනම් 40%ක් ජනමාධ්‍යවේදීන්, ලේඛකයන් සහ කලාකරුවන් මර්දනයට සම්බන්ධ ඒවා විය. ශිෂ්‍ය ක්‍රියාකාරීන් මර්දනයට අදාළව සිද්ධි 8%ක් ද විය. එක් සිද්ධියක් පොලිස් නිලධාරියකුට සිදු කරන ලද තර්ජනයක් සම්බන්ධයෙනි. 24%ක් සිද්ධි අනෙකුත් ක්‍රියාකරීන්ට සම්බන්ධ වූ අතර 12%ක් සිද්ධි අනෙකුත් සිවිල් වැසියන්ගේ අයිතිවාසිකම් සහ නිදහස මර්දනය කිරීමට සම්බන්ධ සිද්ධි වේ. අනෙකුත් සිවිල් වැසියන් යන්නෙන් අදහස් වුයේ පතල් ව්‍යාපාරයකට එරෙහිව උද්ඝෝෂණය කළ අය, වෙසක් සැරසිලි ඡායාරූප ගත කිරීම නිසා අත්අඩංගුවට පත් වූ තරුණයින් සහ කළු කොඩි එසවීමට තහනම් කරන ලද අයයි.

## III. විධායක සාරාංශය

අප්‍රේල් 21 වැනි දින පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර ගණනාවක් කොළඹ, ගම්පහ සහ මඩකලපුවේ පිහිටි දේවස්ථාන තුනක්, කොළඹ පිහිටි ප්‍රධාන සංචාරක හෝටල් තුනක් වෙත එල්ල වු අතර එය සිදු කරන ලද්දේ ඉස්ලාමීය ත්‍රස්තවාදී සංවිධානයක් විසිනි. සිද්ධිවලින් 253 දෙනෙකු මිය ගිය බව රජය ප්‍රකාශ කරන ලදී. මෙම සිද්ධියෙන් පසු රට පුරා හදිසි නීතිය ප්‍රකාශ කරන ලද අතර, මුස්ලිම් ජාතිකයන් කෙරේ වෛරය පතුරවන කණ්ඩායම්වලට සහ ජාතිකවාදී පිරිස්වලට මෙම තත්වය තුළ පිළි ගැනීමක් සහ ජනප්‍රියත්වයක් ලැබුනි. විවිධ සිද්ධිවල දී වින්දිතයන් බවට පත් වූ මුස්ලිම් ජාතිකයන් සම්බන්ධයෙන් අදහස් දැක් වූ ජනමාධ්‍යවේදීන් සහ කලාකරුවන් සමාජ මාධ්‍ය තුළ සංවිධානාත්මක ලෙස වෛරී කතාබහට ඉලක්ක කරන ලදී. අඩුම ගණනින් ජනමාධ්‍යවේදීන් 3 දෙනෙකු සිය රාජකාරිය ඉටු කිරීමේ දී, හෝ තම නිවෙස්වල රැදී සිටිය දී ත්‍රස්තවාදයට අදාළ වැරැදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන පසුව ඇප මත නිදහස් කරන ලදී.

එසේම පසුගිය වසරේ සිට දක්නට ලැබුණු ප්‍රවණතාවක් වන බෞද්ධාගම විවේචනය කරන ලේඛකයන් මුහුණ පෑ අභියෝග සහ මර්දනයන් මෙම මාස තුන තුළ තවදුරටත් තදබල සේ වර්ධනය විය. එක් ලේඛකයකු අත්අඩංගුවට පත් වූ අතර, ජනමාධ්‍යවේදියකු පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ඇති 'සිංහල-බෞද්ධ ප්‍රචණ්ඩත්වය' ගැන කතා කිරීම නිසා අත්අඩංගුවට පත්වීමට ආසන්න තත්වයක් ඇති විය. තවත් මාධ්‍ය ආයතනයක හිමිකරුවකුට පොතක් දොරට වැඩුමක දී කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් බුද්ධාගමට අපහාස කිරීම මත වෛරය පැතිර වී යැයි නඩුවක් පවරන ලදී. එසේම බෞද්ධ හිමිනමක් විසින් ප්‍රසිද්ධ උත්සවයක දී සිදු කරන ලද වෛරී ප්‍රකාශයක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කළ මානව හිමිකම් ක්‍රියාධරයකුට එරෙහිව පලිගැනීමක් ලෙස තවත් පැමිණිලි කරන ලද්දේ වෛරී ප්‍රකාශ කළැයි ඔහු අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලමිනි. වාර්තා වෙන ආකාරයට මෙම සිද්ධීන්ගේ බහුතරයකට, සහ පසුගිය වසර කිහිපයක් තුළ දීම මෙවැනි ආකාරයේ සිදුවීම්වලට අදාළව පැමිණිලි කර ඇත්තේ බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය නම් එක් රැඩිකල් භික්ෂු සංවිධානයක් වන අතර ඔවුන් 2013 වසරේ දී අතුරුදහන් වූවන්ගේ පවුල් පිළිබඳ රැස්වීමක් කඩාකප්පල් කිරීමෙන් පසුව ප්‍රසිද්ධියට පත් වූ අය වී ඇත.

උතුරු නැගෙනහිර අදාළව සිදුවෙන මර්දනය සම්බන්ධ ප්‍රවණතාවය පෙර කාර්තුවල මෙන්ම, මෙම කාර්තුවේ ද පැහැදිලිව දක්නට ලැබුනි. යුද්ධයේ අවසන් වීම ගැන ස්මරණ උත්සව සංවිධානය කළ ශිෂ්‍යයන්ට තර්ජනය කරනු ලැබුනි. මුලතිවු හි මතභේදයට තුඩු දී ඇති බෞද්ධ පන්සලක් සම්බන්ධයෙන් උසාවි නියෝගයක් ඉටු කළේ දැයි වාර්තා කිරීමට ගිය ජනමාධ්‍යවේදියකුට පොලිසිය විසින් පහර දුන් බවට වාර්තා විය. අතුරුදහන් වූවන්ගේ රැස්වීම්වලට පැමිණ බිය ගැන්නවීමේ කටයුතු සිදු කරන බුද්ධි අංශ නිලධාරියකු හෙළිදරව් කිරීම නිසා තවත් ජනමාධ්‍යවේදියකු අත්අඩංගුවට ගනු ලැබුනි. එසේම උතුරු නැගෙනහිර පිහිටි මානව හිමිකම් සංවිධානයක කාර්යාලය හමුදාව විසින් වටලන ලද අතර, සැක සහිත කිසිවක් හමු නොවූවත්, සංවිධානයේ කාර්ය මණ්ඩලය වාචිකව අපයෝජනය කර ඇත. දීර්ඝ කාලීන ලෙස අතුරුදහන් වූවන්ගේ පවුල්වල උද්ඝෝෂණයන්

හා සම්බන්ධ වූ ක්‍රියාකාරිකයකු ප්‍රශ්න කිරීමට භාජනය විය. කර්මාන්තශාලාවකින් ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව උද්ඝෝෂණය කළ අය අත්අඩංගුවට ගන්නා ලදී.

සරල ආකාරයේ ප්‍රකාශනයේ ස්වරූප වන ඇඳුම්, (ප්‍රසිද්ධ ස්ථානවලදී) ඡායාරූප ගැනීම නිසා අත්අඩංගුවට ගැනුනු අතර, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මිය ගිය අය වෙනුවෙන් කලු කොඩි එසවීම තහනම් කිරීමට ද පොලිසිය උත්සාහ කරන ලදී.

තවද වෙනස් කොට සැලකීමට භාජනය වන අවදානම් සහගත ප්‍රජාවන්ට විශේෂයෙන් LGBTIQ ප්‍රජාව, සරණාගතයන් සහ රැකවරණ පතන්නන්ට සහ මුස්ලිම් කාන්තාවන්ට තවදුරටත් වෙනස් කොට සැලකීමට සහ හිරිහැරකිරීම්වලට ලක් වීමට සිදුවිය. LGBTIQ ප්‍රජාවේ වාර්ෂික ප්‍රයිඩ් (අභිමානය) උත්සවය දුෂ්කරතාවලට භාජනය විය. පාස්කු-ඉරිදා ප්‍රහාරයෙන් පසුව සරණාගතයන්ට ඔවුන්ගේ නවාතැන් ස්ථානවලින් ඉවත් වෙන ලෙස බල කෙරුණු අතර, ඔවුන්ගෙන් ඇතැමෙකුට කලහකාරී පිරිස් විසින් තර්ජනය කර පහර දෙන ලදී. සරණාගතයන් සමග වැඩ කරන සංවිධාන ද වැඩි වූ අවේක්ෂණයට (surveillance) සහ හමුදාව සහ පොලීසියේ සෙවීම්වලට භාජනය වූ අතර, සරණාගතයන්ට සහාය සහ ආරක්ෂාව ලබා දීමට කටයුතු කළ මානව හිමිකම් ක්‍රියාධරයකු පහර දීමට සහ පහර දීමේ තර්ජනවලට ලක් විය. හදිසි නීති යටතේ මුහුණු ආවරණය (හිජාබ් සහ නිකාබ් ඇතුළුව) තහනම් කළ පසු, එවැනි ඇඳුම් නොහැඳි මුස්ලිම් කාන්තාවන් පවා ප්‍රසිද්ධ ස්ථානවලදී හිරිහැරවලට ලක් වූ අතර, හදිසි නීතිය වෙනස් කොට සැලකෙන ලෙස ඔවුන් කෙරේ භාවිතා විය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම මැදිහත් වීම් ගණනාවක් සිදු කරන ලදී[1]. තවත් සිදුවීමක දී රහස් පොලිසියට සම්බන්ධ පොලිස් නිලධාරියකු වෙත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන බෞද්ධ භික්ෂුවක් විසින් උසාවි පරිශ්‍රයේ දී තර්ජනය කළේ මුස්ලිම් වෛද්‍යවරයකුට එරෙහිව සිදුකරන ලද වර්ගවාදී චෝදනාවකට අදාළ නඩුවක් සම්බන්ධයෙන් සහයෝගය ලබා දීම හේතුවෙනි. එම සිද්ධියේ දී, ජාතික පුවත්පතක් විසින් චෝදනා කළ පරිදි සිසේරියන් සැත්කම් සිදු කරන අතරතුර

---

[1] මුස්ලිම් කාන්තාවන්ට සහ මුස්ලිම් පුද්ගලයන්ට අදාළ වෙනස්කොට සැලකීමට සහ හිරිහැර කිරීමට අදාළ මේ සිද්ධි මෙම වාර්තාවේ අඩංගු නොවේ. වැඩිදුර තොරතුරු පහත ලින්කු වෙතින් ලබා ගත හැකිය.

(1) නීතිඥයන්ගේ වෙනස් කොට සලකන චර්යාවන් ගැන මානව හිමිකම් කොමිසම නීතිඥ සංගමයට ලියූ ලිපිය http://hrcsl.lk/english/wp-content/uploads/2019/06/HRCSL-letter-to-Bar-Association-of-Sri-Lanka.pdf
(2) ඇඳුම් සම්බන්ධයෙන් මෑත දී පැනවූ චක්‍රලේඛය සම්බන්ධයෙන් මහජන පරිපාලන අමාත්‍යාංශයට මානව හිමිකම් කොමිසමට ලියයි http://hrcsl.lk/english/2019/06/04/hrcsl-writes-to-ministry-of-public-administration-on-recent-circular-on-dress-code/
(3) මානව හිමිකම් කොමිසම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිට උසස් අධ්‍යාපනය ආයතනවල වෙනස්කොට නොසැලකීම තහවුරු කිරීමට ගත යුතු පියවර ගැන ලියයි http://hrcsl.lk/english/2019/05/25/hrcsl-writes-to-chairman-university-grants-commission-on-need-to-ensure-non-discrimination-in-institutions-of-higher-education/
(4) HRCSL writes to Chambers of Commerce requesting non-discrimination in enforcing security measures. http://hrcsl.lk/english/2019/05/24/hrcsl-writes-to-chambers-of-commerce-requesting-non-discrimination-in-enforcing-security-measures/
(5) මානව හිමිකම් කොමිසම මහජන ආයතනවලින් ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීමේ දී වෙනස් කොට නොසලකන ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලමින් ලියයි. http://hrcsl.lk/english/2019/05/24/hrcsl-writes-to-public-authorities-calling-for-non-discrimination-in-enforcing-security-measures/

එම වෛද්‍යවරයා විසින් සිංහල කාන්තාවන් සඳහා කැමැත්තෙන් තොර වඳ සැත්කම් සිදු කිරීමෙන් පසුව අත්අඩංගුවට ගන්නා ලදී. එසේම ඔහුට නීති විරෝධී සහ සැකසහිත ආකාරයෙන් විශාල වත්කම් ඉපැයීමේ චෝදනාව ද එල්ල විය. පරීක්ෂණවලින් පසුව, අපරාධ පරීක්ෂණ අංශය (CID) උසාවියට දැනුම් දුන්නේ චෝදනා ඔප්පු කිරීමට කිසිදු සාක්ෂියක් නොමැති බවයි[2].

එසේම මාධ්‍ය වාර්තා කළේ දුම්රිය වැඩ වර්ජනයක නියැලුනු පුද්ගලයන්ට එරෙහිව පරීක්ෂණයක් පොලිසිය විසින් ආරම්භ කළ ඇති බවයි. 'හදිසි නීති' යටතේ 'අත්‍යවශ්‍ය සේවා' යැයි නම් කරන ලද සේවාවන් ගණනාවක් සම්බන්ධයෙන් වැඩ වර්ජන සිදු කිරීම තහනම් කර ඇති අතර මෙයට තේ, පොල්, රබර්, ඇඟළුම් මෙන්ම රජයේ ඕනෑම සේවාවක් අඩංගු විය හැකිය. එසේම තවත් ප්‍රවණතාවක් වන්නේ 2007 අංක 54 දරන සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පනත අවභාවිතා කරමින් ලේඛකයන්, ජනමාධ්‍යවේදීන් සහ සිවිල් වැසියන් මර්දනය කිරීමට යොදා ගැනීමයි. එසේම ත්‍රස්තවාදය වැළැක්වීමේ නව ප්‍රති-ත්‍රස්ත පනත රටේ ඇති වූ හදිසි තත්වය මත නැවත ගෙන එන බවට අගමැතිවරයා විසින් කිහිප වරක්ම ප්‍රකාශ කරන ලදී. එම පනත පෙර සමාජ ක්‍රියාකාරීන්, විරුද්ධ දේශපාලන පක්ෂ, සහ මාධ්‍ය සංවිධාන විසින් විරෝධය පළ කිරීමෙන් පසුව රජය විසින් ගෙන ඒම තාවකාලිකව නවත්වන ලද එකකි.

පාස්කු ප්‍රහාරයෙන් රටේ ඇති වූ තත්වය තුළ දීර්ඝ කාලීන ලෙස ගෙන ආ මානව හිමිකම් අරගල දුර්වල විය, ඒවාට ලැබුනු ඉඩකඩ අඩුවිය. හදිසි නීතිය යටතේ එක් රැස්වීමේ නිදහස සීමා කළ හැකි බැවින් බොහෝ අවස්ථාවල දී ක්‍රියාකාරීන්ට ප්‍රසිද්ධියේ එක් රැස්වීමට සහ විරෝධය දැක්වීමට සංවිධානය වීමටත්, ඒ සඳහා මහජන සහයෝගය ලබා ගැනීමටත් ඇති ඉඩකඩ සීමා විය. ආරක්ෂාව පදනම් කර ගත් රාජ්‍යයක අවශ්‍යතාවය වඩ වඩාත් රජය විසින් මෙන්ම, ජනමාධ්‍ය සහ මහජන කතිකාවත විසින් ද මතු කරන ලද අතර, මානව හිමිකම්වලට ඇති ප්‍රමුඛතාවය අඩු විය. මෙම තත්වය දීර්ඝ කාලීන ලෙස ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය සම්බන්ධයෙන් බලපානු ඇත.

---

[2] CID informs Court no evidence found for all allegations against Dr. Shafi Shihabdeen http://www.ft.lk/front-page/CID-informs-Court-no-evidence-found-for-all-allegations-against-Dr--Shafi-Shihabdeen/44-680838 accessed on 20th August 2019

## IV. සිදුවීම් ලැයිස්තුව

| | දිනය | ස්ථානය | සිද්ධිය | මූලාශ්‍ර |
|---|---|---|---|---|
| **(A)** | රැස්වීමේ නිදහස සහ සංගමය | | | |
| 01 | මැයි 18 | යාපනය විශ්වවිද්‍යාලය | අනුස්මරණ උත්සවයක් සංවිධානය කරමින් සිටි විශ්වවිද්‍යාල සිසුන් හට හමුදාවෙන් තර්ජනය කිරීමක් | https://www.tamilguardian.com/content/jaffna-uni-students-defy-threats-mark-may-18 |
| 02 | ජූනි 17 | කොළඹ | කොළඹ අභිමානය (pride) නිරීක්ෂණය කිරීමකට හා තර්ජනයට භාජනය වීමක් | EQUAL GROUND |
| 03 | ජූනි 13 | මඩකලපුව | ඉල්මනයිට් පතල් කැණීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට විරෝධය පළ කරමින් සිටි විරෝධතාකරුවන් සිව් දෙනෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. | https://www.tamilguardian.com/content/four-batticaloa-ilmenite-protestors-arrested |
| 04 | ජූනි 20 | වවුනියාව | පුද්ගලයින් අතුරුදහන් වීමේ සිද්ධීන්වලට විරෝධී ක්‍රියාකාරිකයෙකු සහ වවුනියා අතුරුදහන් වූවන්ගේ පවුල් වල ලේකම් කේ. රාජ්කුමාර්ගෙන් පොලිස් ත්‍රස්තවාදී විමර්ශන අංශය ප්‍රශ්ණ කිරීමක්. | https://www.tamilguardian.com/content/vavuniya-disappearances-activist-questioned-tid |
| 05 | ජූනි 30 | මන්නාරම | මන්නාරම සිවිල් සමාජ සංවිධානයක් වන මන්නාරම සමාජ හා ආර්ථික සංවර්ධන සංවිධානය (MSEDO) ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් කිහිප දෙනෙකුගේ නායකත්වයෙන් හමුදා නිලධාරීන් පිරිසක් විසින් හදිසියේ වැටලීමකට | https://www.tamilguardian.com/content/mannar-tamil-civil-society-org-raided-and-threatened-sri-lankan-army |
| 06 | ජූනි 29 | කොළඹ | හදිසි නීතිය යටතේ දුම්රිය සේවය අත්‍යවශ්‍ය සේවාවක් ලෙස රජයේ ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව කම්කරු වැඩ වර්ජන නීති විරෝධී බවට පත් කිරීමෙන් අනතුරුව දුම්රිය සේවකයින් විසින් කම්කරු වැඩ වර්ජනයක් පැවැත්වීම සම්බන්ධයෙන් පොලීසිය පරීක්ෂණයක් ආරම්භ කර තිබේ. | http://www.sundaytimes.lk/article/1093303/police-probe-railway-unions-strike |

| **(B)** | **අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස** | | | |
|---|---|---|---|---|
| 07 | මැයි 19 | රත්නපුර | වෙසක් පොහොය දිනට පසු දින වෙසක් සැමරුම් ඡායාරූප ගත කිරීම සම්බන්ධයෙන් තරුණයන් තිදෙනෙකු රත්නපුර පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ | https://www.newsfirst.lk/2019/05/20/three-persons-arrested-for-photographing-vesak-decorations/ |
| 08 | අප්‍රේල් 23 | යාපනය | පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසු යාපනය දිස්ත්‍රික්කයේ කළු කොඩි එසවීම තහනම් කරනු ලැබූ අතර කළු කොඩි ඉවත් කිරීමට පොලිසියෙන් මිනිසුන්ට බල කර ඇත. | https://www.tamilguardian.com/content/sri-lanka-police-ban-anti-government-black-flags-jaffna |
| 09 | මැයි 28 | කොක්කිලායි, මුලතිව් දිස්ත්‍රික්කය | මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි පොලිස් ස්ථානය භාර පොලිස් නිලධාරියා විසින් මාධ්‍යවේදී කේ. කුමනන් හට පහර දී ඇත. | https://www.tamilguardian.com/content/sri-lankan-police-assault-tamil-journalist-mullaitivu |
| 10 | මැයි 2 | මීගමුව, ගම්පහ දිස්ත්‍රික්කය | පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාවේ තත්වය ආවරණය කරමින් සිටි රොයිටර් පුවත්පතේ ඡායාරූප මාධ්‍යවේදියෙකු අත්අඩංගුවට ගෙන තිබේ. | https://colombogazette.com/2019/05/02/reuters-photographer-arrested-in-negombo-and-remanded/ |
| 11 | අප්‍රේල් 20 | මුලතිවු | ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අනුව මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. | https://www.tamilguardian.com/content/tamil-guardian-mullaitivu-correspondent-arrested-and-charged |
| 12 | මැයි 13 | අනුරාධපුර | මාධ්‍යවේදී මොහොමඩ් රිස්වි මහරූෆ් අත්අඩංගුවට ගනී. | https://srilankamirror.com/news/14036-a-journalist-arrested-with-cds |
| 13 | මැයි 9 | සඳහන් කර නැත | ෂැන්ග්‍රි-ලා හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බ කරු සම්බන්ධයෙන් පළ වූ ප්‍රවෘත්තිවල පුවත්පත් සටහන් ලග තබා ගැනීම සම්බන්ධයෙන් තිනකරන් පුවත්පතේ මාධ්‍යවේදියෙකු අත්අඩංගුවට ගෙන දින තුනක් රඳවා තබා ගෙන තිබේ. | https://www.tamilguardian.com/content/thinakaran-journalist-arrested-over-newspaper-clippings |
| 14 | අප්‍රේල් 24 | අන්තර්ජාලය | සංවිධානාත්මක කණ්ඩායමක් විසින් බීබීසී මාධ්‍යවේදී අසාම් අමීන්ට එරෙහිව සමාජ මාධ්‍යවල වෛරී කථාවක් සහ ජාතිවාදී අදහස් දැක්වීමක් සිදුවේ. | https://www.facebook.com/AzzamAmeenSL/photos/a.1528196514153669/2006966189610030/?type=3&theater |
| 15 | මැයි 2 | අන්තර්ජාලය | නිළියක් සහ සමාජ ක්‍රියාකාරිනියක වන දීපානි සිල්වා ඉලක්ක කොට ගනිමින් | |

| | | | | |
|---|---|---|---|---|
| | | | සමාජ මාධ්‍යන්හි වෛරී කථා ප්‍රචාරණය වේ. | |
| 16 | ජුනි 14 | කොළඹ | පවර් හවුස් ලිමිටඩ් මීඩියා සමාගමේ හිමිකරු වන දිලිත් ජයවීරට එරෙහිව පොත් එළිදැක්වීමේ උත්සවයේදී ඔහු කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් නඩු පවරා ඇති අතර පොතේ කතුවරයාගෙන්ද ප්‍රශ්න කිරීමක් සිදු කොට තිබේ. | https://www.colombotelegraph.com/index.php/dilits-speech-incurs-buddhist-monk-wrath/ |
| 17 | අප්‍රේල් 1 | පොල්ගහවෙල, කුරුණෑගල දිස්ත්‍රික්කය | බෞද්ධ ආගමට අපහාස කළ බවට චෝදනා කරමින් කෙටිකතාවක් ලිවීම සම්බන්ධයෙන් ලේඛක ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගෙන රඳවා තබන ලදී | https://www.amnesty.org/en/documents/asa37/0800/2019/en/ |
| 18 | ජුනි 14 | කොළඹ | පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු සිංහල-බෞද්ධ ප්‍රචණ්ඩත්වය විවේචනය කරමින් ලිපියක් ලිවීම හා ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදී කුසල් පෙරේරා සහ ඩේලි මිරර් පුවත්පතට එරෙහිව පොලිසිය විසින් පරීක්ෂණ ආරම්භ වේ. | https://www.srilankamirror.com/news/14490-senior-journalist-kusal-perera-under-threat |
| **(C)** | **මර්දනකාරී නීති** | | | |
| 19 | අදාළ නොවේ | අදාළ නොවේ | 2019 වර්ෂයේ මෙම කාර්තුවේදී 2007 අංක 56 දරණ ICCPR (සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය) පනත අවස්ථා කිහිපයකදී අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ කතා කිරීමේ නිදහස මැඩපැවැත්වීම සඳහා බලධාරීන් විසින් අනිසි ලෙස භාවිතා කිරීමක් සිදුවිය. | http://srilankabrief.org/2019/06/sri-lanka-fmm-condemns-the-attempts-to-suppress-journalists-and-media-using-the-iccpr-act/ |
| 20 | අප්‍රේල් 22 - අගෝස්තු 22 | අදාළ නොවේ | පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසු ජනාධිපතිවරයා වහාම ක්‍රියාත්මක වන පරිදි රට පුරා හදිසි රෙගුලාසි නීතිය බලාත්මක කළ අතර එය පාර්ලිමේන්තු අනුමැතිය ඇතිව අගෝස්තු 22 දක්වා තවත් මාස හතරකින් දීර්ඝ කරන ලදී. | Emergency Regulations http://www.documents.gov.lk/files/egz/2019/4/2120-05_E.pdf<br><br>https://www.newsfirst.lk/2019/08/23/emergency-regulations-would-not-be-extended-secretary-of-defence/ |

| | | | | |
|---|---|---|---|---|
| 21 | අප්‍රේල් 28 සහ මැයි 8 | අදාළ නොවේ | පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ආණ්ඩුව අවධාරණය කර සිටියේ මීට පෙර ගෙන ආ මතභේදාත්මක ප්‍රතිත්‍රස්ත මර්දන පනත (CTA) නැවත ගෙන ආ යුතු බවයි. එමෙන්ම අගමැතිවරයා මේ සම්බන්ධයෙන් විශේෂ ප්‍රකාශයක් නිකුත් කළ අතර මෙම පනත සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තු සහායද ඉල්ලා සිටියේය. | http://www.pmoffice.gov.lk/download/press/D00000000080_EN.pdf<br><br>Hanzard on 8th May https://www.parliament.lk/uploads/documents/hansard/1557814989037767.pdf |
| **(D)** | **අනෙකුත් හිංසනයන් හා උල්ලංඝන** | | | |
| 22 | මැයි 3 | යාපනය | යාපනය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් සහ සභාපති අත්අඩංගුවට | http://www.dailymirror.lk/front_page/Jaffna-Uni-Students-Union-President--secretary-arrested-with-Prabha-posters/238-166440 |
| 23 | ජුනි 27 | කොළඹ | අස්ගිරි පාර්ශවයේ ප්‍රධාන බෞද්ධ නාහිමිවරයා විසින් සිදු කරන ලද වෛරී කථන අදහස් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඉල්ලා සිටි සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු සහ ප්‍රතිපත්ති විකල්ප මධ්‍යස්ථානයේ (CPA) විධායක අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තුට එරෙහිව බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් සහ ජනවාර්ගික කණ්ඩායම්වලින් පලිගැනීමේ ක්‍රියාකාරකම් | අන්තවාදී ප්‍රකාශයන්ට එරෙහිව පාක්‍යසෝති සරවනමුත්තුට එරෙහිව පැමිණිල්ලක්... https://youtu.be/AMA1nbeN68M |
| 24 | ජුනි 27 | කුරුණෑගල | මුස්ලිම් වෛද්‍යවරයෙකුට එරෙහිව ජනවාර්ගික ලෙස පක්ෂපාතී වී කටයුතු නොකිරීම ගැන බෞද්ධ භික්ෂුවක් වන පා.ම. අතුරලියේ රතන හිමි විසින් මහේස්ත්‍රාත් අධිකරණයක දී සී.අයි.ඩී පොලිස් නිලධාරියෙකුට තර්ජනය කිරීම | http://www.ft.lk/front-page/CID-informs-Court-no-evidence-found-for-all-allegations-against-Dr--Shafi-Shihabdeen/44-680838 |
| 25 | අප්‍රේල් 23 සිට අද දින දක්වා | මීගමුව සහ අනෙකුත් ප්‍රදේශ | පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාවේ රැදී සිටින සරණාගතයින් ඔවුන්ගේ නවාතැන් වලින් ඉවත් කරනු ලැබූ අතර තවත් සමහරෙකුට තර්ජන හා ශාරීරික හිංසනයන්ට ද මුහුණ පෑමට සිද්ධ විය. එමෙන්ම සරණාගතයින්ට සහාය වන මානව සම්පත් සංවර්ධන සංවිධාන කිහිපයකටම හිරිහැර කිරීම් හ බිය ගැන්වීම්, කායිාල වැටලීම් සහ කායිාලවලින් පිටත විරෝධතාවයන් වලට මුහුණ දීමටද සිදු වී තිබේ. | |

## A. එක් රැස්වීමේ සහ සංවිධානය වීමේ නිදහස

### 1. මැයි 18 වනදා මළවුන් සැමරූ යාපනයේ විශ්වවිද්‍යාල සිසුන්ට තර්ජන

මැයි 18 වන දින යාපනය විශ්වවිද්‍යාලයේ මුල්ලිවයික්කාල් ස්මාරකය ආසන්නයේ ගෙන ගිය සැමරීම නැවැත්වීමට හමුදාව හා පොලීසිය විසින් සිසුන්ට හා සේවක මණ්ඩලයේ පිරිසකට තර්ජන එල්ල කොට ඇත. කෙසේ වෙතත් තර්ජන නොතකා ඔවුන් සැමරීම සිදු ඇති බව ටැමිල් ගාර්ඩියන් වෙබ් අඩවිය වාර්තා කොට ඇත. මීට පෙර සිදු වු සිද්ධියක දී ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීමෙන් පසුව[3], විශ්වවිද්‍යාලය දින නියමයකින් තොරව ඊට පෙර සතියේ සිට වසා දමා තිබෙන අතරතුර කාලයේ දී මෙම සැමරුම සිදු කොට ඇත[4].



(යාපනය විශ්වවිද්‍යාලයේ මුල්ලවෛකාල් ස්මාරකය අසල විශ්වවිද්‍යාල සිසුන් හා සේවක මණ්ඩලය රැඳී සිටින ආකාරය- පින්තූරය ටැමිල් ගාඩියන්)

### 2. කොළඹ අභිමානය (Colombo Pride) උළෙල අභියෝග මැද පැවැත්වේ.

ශ්‍රී ලාංකීය LGBTIQ ප්‍රජාව සහ ඊකුවල් ග්‍රවුන්ඩ් ආයතනය විසින් සංවිධානය කරන කොළඹ අභිමානය උළෙල 15 වැනි වතාවටත් කොළඹ දී ජුනි 11-ජුනි 23 අතර කාලයේ පැවැත්වුනි. මෙවර පළමු වරට පාගමනක් සූදානම් කිරීමට සැලසුම් කර තිබූ නමුදු රටේ පවතින ආරක්ෂක වාතාවරණය මත එය අවලංගු කරන ලදී. එසේම උළෙලේ පැවැති අභිමානී චිත්‍රපට උළෙල බුද්ධි අංශවල අවේක්ෂණයට (surveillance) ලක් වූ බවට සංවිධායකයන් විසින් ප්‍රකාශ කරන ලදී. එසේම චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා නිසි නීතිමය අවසර ගෙන තිබියදී පොලිසිය විසින් චිත්‍රපට උළෙලට පැමිණෙන අය සහ සංවිධාකයන් අත්අඩංගුවට ගත හැකි බවට තර්ජනය කර තිබූ අතර, චිත්‍රපටවල පිටපත් පොලිසියට ලබා දෙන ලෙස බලපෑම් කර ඇත. ජුනි 17 වැනිදා තිරගත කළ චිත්‍රපටයේ පිටපතක් ලබා දෙන ලෙස

---

[3] මේ වාර්තාවේ වෙනත් මාතෘකාව යටතේ ඇති 19 වැනි සිද්ධිය බලන්න.

[4] Tamil Guardian “Jaffna Uni students defy threats to mark May 18” published on 18th May 2019 https://www.tamilguardian.com/content/jaffna-uni-students-defy-threats-mark-may-18

ඊකුවල් ග්‍රවුන්ඩ් කාර්ය මණ්ඩලයට බලකර ඇත. අනෙකුත් චිත්‍රපටවල ද පිටපත් පොලිසියට ලබා දෙන ලෙස ඉල්ලූ අවස්ථාවේ ඊකුවල් ග්‍රවුන්ඩ් ආයතනය විසින් ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය හා සම්බන්ධ වී ඇති අතර, ඔවුන් කියා ඇත්තේ සිය අවසරය නොමැතිව කිසිදු තුන්වන පාර්ශ්වයකට චිත්‍රපට ලබා නොදිය බවත්, ඊකුවල් ග්‍රවුන්ඩ් වෙත අවසර ලබා දී ඇත්තේ චිත්‍රපට පෙන්වීමට පමණක් බවත්ය. එසේම කුරුඳුවත්ත පොලිසිය විසින් සිදු කළ පරීක්ෂණයක දී ඊකුවල් ග්‍රවුන්ඩ් කාර්ය මණ්ඩලය ප්‍රශ්න කර ඇත. පොලිසිය ප්‍රකාශ කර ඇති පරීක්ෂණය සිදු කරන ලද්දේ කුරුඳුවත්ත ප්‍රදේශයේ සිටි තැනැත්තකු විසින් සිදු කරන ලද පැමිණිල්ලක් පදනම් කර ගනිමිනි. ඊකුවල් ග්‍රවුන්ඩ් ප්‍රකාශ කරන පරිදි එකී පුද්ගලයා චිත්‍රපට උළෙල සහ LGBTIQ ප්‍රජාව ඉලක්ක කර ගෙන ෆේස්බුක් සමාජ මාධ්‍ය තුළ වෛරී අන්තර්ගතයන් බෙදා ගෙන ඇත. පසුව කොළඹ ප්‍රයිඩ් එම උත්සව අංග මාලාවේ ම වෙනත් අංගයක් සඳහා පැමිණි අයගේ අනන්‍යතාවය සංවිධායකයන් විසින් පරීක්ෂා කළ අවස්ථාවේ දී එසේම පැමිණි අයෙක් තමන් බුද්ධි අංශවල අය බවට පිළිගෙන තිබෙන අතර, තමන් පැමිණියේ “ආරක්ෂාව” ලබා දීමට යැයි ද පවසා ඇත. එසේ වුවත් පොලිසිය සම්බන්ධ කර මේ ගැන විමසූ විට එවැනි කිසිවකු එවී යැයි පොලිසිය ප්‍රතික්ෂේප කර ඇත.

### 3. උද්ඝෝෂණය කල සිව්දෙනෙක් අත්අඩංගුවට



*කර්මාන්තශාලාව අසල විරෝධතාකරුවන් රැඳී සිටින ආකාරය - පින්තූරය ටැමිල් ගාඩියන්*

ඉල්මනයිට් පතල් කැණීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට විරෝධය දැක්වීමට සහභාගී වූ මඩකලපුවේ පදිංචිකරුවන් සිව් දෙනෙකු ජූනි 13 වැනි දින අත්අඩංගුවට ගෙන ඇත. විරෝධතාකරුවන් එහි දොරටුවට හානි කර ඇති බවත්, එම ස්ථානය තුළ කැරලි කෝලාහල ඇති කළ බවත් ඉල්මනයිට් කම්හලේ කාර්ය මණ්ඩලයෙන් ලැබුණු පැමිණිලි

අනුව මෙම සිව්දෙනා අත්අඩංගුවට ගත් බව වාකරේ පොලිසිය පවසයි. ඊට පසු දින ඔවුන්ව ඇප මත නිදහස් කොට ඇති බව ටැමිල් ගාර්ඩියන් වෙබ් අඩවිය වාර්තා කොට ඇත[5].

## 4. වවුනියාවේ අතුරුදහන් වූවන් පිළිබඳ ක්‍රියාකාරිකයෙකුගෙන් ප්‍රශ්න කෙරේ

වවුනියාව ප්‍රදේශයේ අතුරුදහන් වූ පුද්ගලයින් සම්බන්ධව ක්‍රියා කරන සමාජ ක්‍රියාකාරිකයෙකුගෙන් ත්‍රස්ත විමර්ශන අංශය විසින් ප්‍රශ්න කිරීමක් සිදු කොට ඇත.

වවුනියාව ප්‍රදේශයේ අතුරුදහන් වූවන්ගේ සංගමයේ ලේකම් කේ. රාජ්කුමාර් මහතාගෙන් ත්‍රස්තවාදී විමර්ශන දෙපාර්තුමේන්තුව විසින් ජුනි මස 20 වෙනි දින පැවැත්වුනු විරෝධතාවක් අතරතුර මෙලෙස ප්‍රශ්න කිරීමක් සිදු කොට ඇති බව ටැමිල් ගාර්ඩියන්ස් වෙබ් අඩවිය වාර්තාකොට ඇත[6].

## 5. මන්නාරමේ සිවිල් සංවිධානයක් හමුදාවේ වැටලීමකට

ඉකුත් ජුනි 30 වෙනිදා ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් කිහිප දෙනෙකු විසින් මන්නාරමේ පිහිටි සිවිල් සංවිධානයක් වෙත වටලා ඇති අතර, සැක සහිත කිසිවක් හමු නොවූවත් වාචික ලෙස හිරිහැර සිදු කොට ඇති බව වාර්තා වේ.

මෙලෙස සෝදිසි කර ඇත්තේ මන්නාරමේ පිහිටි (MSEDO) මන්නාරම් සමාජ හා ආර්ථික සංවර්ධන සංවිධානයයි. මෙම සංවිධානය එම ප්‍රදේශයේ ඉඩම් අයිතිය පිළිබඳ හඬ නැගූ සංවිධානයකි. මෙම සෝදිසි මෙහෙයුම සඳහා හමුදා භටපිරිස් දුසිමකට වඩා සිටි බව ද සඳහන් වේ. එමෙන්ම සෝදිසි මෙහෙයුමට කාර්ය මණ්ඩලය එකඟ වුවද, පැමිණ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරියා පැමිණ සිටි කාර්ය මණ්ඩලයට තර්ජනය කොට වාචිකව හිරිහැර කොට කාර්යාලයේ සීසීටීවී කැමරාව ක්‍රියා විරහිත කරන ලෙස ඔවුන්ට නියෝග කොට ඇති බව ටැමිල් ගාර්ඩියන්ස් වාර්තා කර ඇත[7].

## 6. දුම්රිය වැඩවර්ජනය සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයක්

ජුනි 29 වැනි දා සන්ඩේ ටයිම්ස් වෙබ්අඩවිය වාර්තා කරන පරිදි දුම්රිය සේවාව අත්‍යවශ්‍ය සේවාවක් ලෙස හදිසි නීතිය යටතේ ගැසට් කිරීමෙන් අනතුරුව වැඩ වර්ජනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොලිසිය විසින් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. මෙම පරීක්ෂණය ආරම්භ කර ඇත්තේ දුම්රිය සාමාන්‍යාධිකාරී දිලන්ත ප්‍රනාන්දු විසින් කළ පැමිණිල්ලක් පදනම් කර ගෙනය. දුම්රිය අත්‍යවශ්‍ය සේවාවක් කර ඇති තත්වය තුළ එය කඩා කප්පල් කිරීමට කරන ඕනෑම ක්‍රියාවක් වරදක් වේ. ඒ අනුව දුම්රිය වෘත්තීය සමිතිවලින් ප්‍රකාශ සටහන් කර ගන්නා බව පොලිසිය විසින් ප්‍රකාශ කර ඇත[8].

---

[5]Tamil Guardian Four Batticaloa ilmenite protestors arrested 16 June 2019 https://www.tamilguardian.com/content/four-batticaloa-ilmenite-protestors-arrested (last access on 29th June 2019)

[6] https://www.tamilguardian.com/content/vavuniya-disappearances-activist-questioned-tid

[7] Tamil GuardiansMannar Tamil civil society org raided and threatened by Sri Lankan army 02 June 2019 https://www.tamilguardian.com/content/mannar-tamil-civil-society-org-raided-and-threatened-sri-lankan-army ( last accessed on 29th June 2019)

[8] Sunday Times. Police commence investigations into railway unions strike. Published on 29th June 2019. http://www.sundaytimes.lk/article/1093303/police-probe-railway-unions-strike

## B. ප්‍රකාශනයේ නිදහස

### 7. වෙසක් සැරසිලි රූප ගත කළ තරුණයින් තිදෙනෙකු අත් අඩංගුවට

වෙසක් සැරසිලි රූප ගත කිරීම හේතුවෙන් රත්නපුර නගරයේ තරුණයින් තිදෙනෙකු රත්නපුර පොලීසිය විසින් වෙසක් දිනට පසු දින එනම් මැයි 19 වැනි දින අත් අඩංගුවට ගෙන තිබේ. ත්‍රස්තවාදීන්ට ලබා දීම සඳහා කැමරාවක් සහ ඩ්‍රෝන කැමරාවක් යොදා ගනිමින් රත්නපුර නගරය රූප ගත කළේ යැයි භික්ෂූන් වහන්සේ නමක් ප්‍රමුඛ පිරිසක් විසින් කරන ලද පැමිණිල්ලකට අනුව, මෙලෙස රත්නපුර ප්‍රදේශයේ පදිංචි සමාජ ක්‍රියාකාරියෙකු වූ සබරගමුව විශ්වවිද්‍යාලයේ අනුෂ්ක ඩිල්හාර නැමැත්තෙකු සහ ඔහුගේ මිතුරන් වන මුස්ලිම් තරුණයින් දෙදෙනෙකු මෙලෙස අත් අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු පවරා ඇත[9]. මේ අය ඡායාරූප ගත්තේ එසේ කිරීමට නීතිමය තහනමක් ඇති ප්‍රදේශයක නොවේ. ඉන්ෆෝම් විශ්වාස කරන ආකාරයට ඡායාරූප ගැනීමට මුස්ලිම් පුද්ගලයන් සම්බන්ධ වූ බැවින් ද, චෝදනාව එල්ල කළේ බෞද්ධ භික්ෂුවක් බැවින් ද මෙම පුද්ගලයන් ඔවුන්ගේ ජනවර්ගය පදනම් කර ගෙන අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන ඇත. මසකට අධික කාලයක් තිස්සේ රඳවා ගෙන සිටි මේ අයට ජුනි 26 වැනි දින ඇප ලැබුනු බව ජනයුගය පුවත්පත වාර්තා කරයි.

### 8. යාපනයේ පොලිසිය කලු කොඩි එසවීම තහනම් කරයි

පාස්කු ඉරිදා බෝම්බ පිපිරීමෙන් විපතට පත් වූවන් වෙනුවෙන් අප්‍රේල් 23 වැනි අඟහරුවාදා දිනය දිවයින පුරා වැලපෙන දිනයක් ලෙස වෙන් වී තිබූ අතර ඒ සඳහා යාපනයේ ජනයා විසින් කළු කොඩි එසවීම යාපනයේ පොලිසිය විසින් තහනම් කරන ලදී. එලෙස තහනම් කරන ලද්දේ කළු කොඩි එසවීම රජයට එරෙහි විරෝධතාවයක් සේ පෙනී යන හෙයින් බව වාර්තා වේ. එමෙන්ම නෙල්ලියාඩි පොලිසිය කළු කොඩි ගලවා ගන්නා ලෙස ප්‍රදේශවාසීන්ට බල කළ අතර වින්දිතයා සිහි කිරීම සඳහා සුදු කොඩි තැබීමට ඔවුන් දිරිමත් කිරීමට උත්සාහ කළ ඇත[10].

---

[9] News First Three persons arrested for photographing Vesak decorations 20 May, 2019 https://www.newsfirst.lk/2019/05/20/three-persons-arrested-for-photographing-vesak-decorations/

[10] Tamil Guardians Sri Lanka police ban 'anti-government' black flags in Jaffna 25th April 2019 https://www.tamilguardian.com/content/sri-lanka-police-ban-anti-government-black-flags-jaffna(last access on 29th June 2019)

## 9. මුලතිව්හි දමිළ මාධ්‍යවේදියකුට පොලිසියෙන් ප්‍රහාර




*මාධ්‍යවේදී කුමනන් හට පහර දී පොලීස් නිළධාරියා විසින් ඔහුව ඡායාරූප කරන අවස්ථාව - පින්තූරය ටැමිල් ගාර්ඩියන්*

මුලතිවුහි මතභේදයට තුඩු දී ඇති නීරාවියඩි පිල්ලෙයාර් කෝවිල් භූමියේ අලුතෙන් ඉදි කර ඇති බෞද්ධ විහාරස්ථානයේ සීසීටීවී කැමරා ඉවත් කිරීම සඳහා වූ අධිකරණ නියෝගයක් ඉටුකිරීමේ ප්‍රගතියක් නොමැති බව පිළිබඳ වාර්තා කිරීම සඳහා මැයි 28 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී එකී පන්සලට ගොස් තිබූ ටැමිල් ගාර්ඩියන්ස් වෙබ් අඩවියේ සහ වීරකේසරී පුවත්පතේ වාර්තාකරු කනපතිපිල්ලෙයි කුමනන් හට මුලතිවුහි කෝකිලායි පොලිස් ස්ථානය භාර පොලිස් නිලධාරියා විසින් පහර දී ඇති බවට ටැමිල් ගාඩියන්ස් වෙබ්අඩවිය වාර්තා කර ඇත. පොලිස් නිලධාරියා මාධ්‍යවේදියාට වාචිකව හා කායිකව පහර දී ඔහුගේ කැමරාව විසි කොට, ඔහුගේ ඡායාරූපයක් ද ගෙන ඇති බව වැඩිදුරටත් සඳහන් වේ[11]. මෙම මාධ්‍යවේදීයා මෙම වසරේ අප්‍රේල් මාසයේ දී තොරතුරු අයිතිවාසිකම මහජන සුභසිද්ධියට අදාළ ජනමාධ්‍යවේදයට (public interest journalism) යොදා ගත් ජනමාධ්‍යවේදියකු ලෙස සම්මානයට පාත්‍ර විය[12].

---

[11] Tamil Guardian Sri Lankan police assault Tamil journalist in Mullaitivu 28 May 2019 https://www.tamilguardian.com/content/sri-lankan-police-assault-tamil-journalist-mullaitivu (last access on 29th June 2019)

[12] Daily FT. "Sri Lanka's Northern Province journalists win awards for using RTI for reporting" published on 11th April 2019 http://www.ft.lk/news/Sri-Lanka-s-Northern-Province-journalists-win-awards-for-using-RTI-for-reporting/56-676314

## 10. පුලිට්සර් ත්‍යාගය දිනූ රොයිටර් මාධ්‍යවේදියා රිමාන්ඩ් භාරයට

පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු රටේ තත්වය ආවරණය කරමින් රොයිටර් පුවත් සේවයේ ඡායාරූප මාධ්‍යවේදියෙකු මැයි මස 2 වනදා පොලිස් අත් අඩංගුවට ගෙන ඇති බව ශ්‍රී ලංකා බ්‍රීෆ් වෙබ් අඩවිය විසින් වාර්තා කරයි. මෙම අත් අඩංගුවට ගැනීම මීගමුවේ මැරිස් ස්ටෙලා විද්‍යාලය අසල දී සිදු කොට ඇති අතර[13], මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ ඩැනිශ් සිද්දික් නැමැති නව දිල්ලියේ ඡායාරූප ශිල්පියෙකු හා මාධ්‍යවේදියෙකු වන අතර, පොලිස් රිමාන්ඩ් භාරයට ගැනීමට ප්‍රථම, අදාළ මාධ්‍යවේදියා ප්‍රාදේශීය මහේස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කළ බවට ද නිලධාරීන් පවසා ඇත. කටුවාපිටිය පල්ලියේ මිය ගිය ශිෂ්‍යයකු සම්බන්ධ තොරතුරු දැන ගැනීමට මාධ්‍යවේදියා එහි පැමිණ ඇත[14]. අදාළ බලධාරීන් විසින් කළ පැමිණිල්ලක් මත පොලිසිය ක්‍රියා කළේ යැයි ද, එකී පාසැලට ජනමාධ්‍යවේදියා විසින් අනවසරයෙන් ඇතුළු වූ බවට චෝදනා එල්ල වී ඇතැයි ද, මැයි මස 2 වනදා සිට මැයි මස 15 දක්වා රිමාන්ඩ් භාරයේ තබා ගැනීමට මහේස්ත්‍රාත් නියම කළ බව එම වෙබ් අඩවිය තව දුරටත් වාර්තා කරයි. එසේ වුවත් ඔහුට පසු දින ඇප ලැබී ඇත. නමුත් මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීම රොයිටර් පුවත් සේවය විසින් ප්‍රතික්ෂේප කර ඇත.[15]

සිද්දික් 2017 අගෝස්තු මාසයේ දී මියන්මාරයේ රෝහින්ග්‍යා ප්‍රජාව මුහුණ දුන් ප්‍රචණ්ඩත්වය වාර්තා කරමින්, 2018 වසරේ දී විශේෂාංග ඡායාරූපකරණය වෙනුවෙන් පුලිට්සර් ත්‍යාගය දිනා ගත් හත් දෙනෙකුගෙන් යුත් රොයිටර් කණ්ඩායමේ එක් සාමාජිකයෙකි[16].

## 11. මුලතිව්හී ටැමිල් ගාර්ඩියන් මාධ්‍යවේදියා අත් අඩංගුවට

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කළ පැමිණිල්ලකට අනුව ටැමිල් ගාඩියන් ජනමාධ්‍යවේදියකු අප්‍රේල් 20 වන දින උදෑසන අත් අඩංගුවට ගත් බව ටැමිල් ගාර්ඩියන්ස් වෙබ් අඩවිය වාර්තා කර ඇත.

මුලතිවු හි ප්‍රමුඛ පෙළේ මාධ්‍යවේදියෙකු වන ෂන්මුගම් තවසීලන් මහතා සිකුරාදා උදෑසන මුලතිව් පොලිසිය විසින් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව මෙලෙස අත්අඩංගුවට ගෙන ඇති බව වාර්තා වේ.

අත්අඩංගුවට ගැනීමට හේතුව වන්නේ අප්‍රේල් 07 වැනි දින අතුරුදහන් වූවන්ට යුක්තිය ඉල්ලමින් පැවැති විරෝධතාවයක්[17] අතරතුර, නාවික හමුදා බුද්ධි අංශ නිලධාරියකු විරෝධතාකරුවන්ගේ ඡායාරූප ගෙන ඇත. මෙහිදී ඔහුගේ අනන්‍යතාවය ගැන

---

[13] Colombo Gazette "Reuters photographer arrested in Negombo and remanded" published on 2nd May 2019 https://colombogazette.com/2019/05/02/reuters-photographer-arrested-in-negombo-and-remanded/

[14] Ibid

[15] Srilankabrief Sri Lanka Arrests Reuters journalists over 'trespass' 03/05/2019http://srilankabrief.org/2019/05/sri-lanka-arrests-reuters-journalists-over-trespass/ (last access on 29th June 2019)

[16] Scroll.in "Pulitzer-winning Indian photojournalist arrested in Sri Lanka for trespass gets bail: Reports" published on 3rd May 2019 https://scroll.in/latest/922176/pulitzer-winning-indian-photojournalist-arrested-in-sri-lanka-for-trespass

[17] https://www.tamilguardian.com/content/mullaitivu-families-urge-international-community-deliver-justice

විරෝධතාකරුවන් සහ අදාළ ජනමාධ්‍යවේදියා විසින් ප්‍රශ්න කර ඇති අතර, එතැනදී ගැටුමක් ඇති වී තිබෙන අතර, ඔහු නාවික හමුදා නිලධාරියකු බව හෙළි වී ඇත්තේ එවිටය. පසුව නාවික හමුදා නිලධාරියා විසින් තමන්ට පහර දුන්නේ යැයි මුලතිවු පොලිසිය වෙත පැමිණිල්ලක් කර තිබෙන අතර, නාවික හමුදා නිලධාරියාට පහර දී තුවාල කළේ යැයි චෝදනා කර ඇත. මෙම චෝදනාව ගෙතූ එකක් බවත්, බිය ගැන්නවීමට සහ හිරිහැර කිරීම උදෙසා සිදු කරන එකක් බවත් ජනමාධ්‍යවේදියාගේ නීතිඥයෝ ප්‍රකාශ කරති. තවසීලන් කියා සිටින්නේ මෙය පලි ගැනීම උදෙසා කළ පැමිණිල්ලක් බවයි. පසුව ඔහු ඇප මත මුදා හරින ලද අතර, පළමු නඩු විභාගය අප්‍රේල් 30 වනදා පැවැත්වී අතර, ඊළඟ නඩු විභාගය සැප්තැම්බර් 10 වෙන දින පැවැත්වීමට නියමිත බව ටැමිල් ගාඩියන් වාර්තා කර ඇත[18].

එම මාධ්‍යවේදියා මෑත වසරවල දී නිරන්තර තර්ජන හා හිරිහැරයන්ට ලක්ව ඇත. අලම්පිල්හි විනාශ වූ එල්ටීටීඊ සුසාන භූමියක සම්බන්ධයෙන් හමුදාව විසින් ඉඩම් අත්පත් කර ගැනීමක් පිළිබඳ වාර්තා කරමින් සිටිය දී තවසීලන් පසුගිය වසරේ දී හමුදා නිලධාරීන් විසින් තාවකාලිකව රඳවාගෙන ඇති අතර එහිදී තර්ජනය කිරීමකට භාජනය වී ඇත. තමාගේ කැමරාව හමුදාවට භාර දීමට කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම නිසා ඔහු මෙලෙස රඳවා තබා ගන්නා ලදී [19]. මෙම සිද්ධි දෙක සම්බන්ධයෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් වෙන වෙනම පරීක්ෂණ පවත්වා ඇති අතර, නාවික හමුදාව විසින් අතුරුදහන් වූවන්ගේ විරෝධතාවයන්ට අනාගතයේ දී මැදිහත් නොවන්නේ යැයි ද ප්‍රකාශ කර තිබේ[20].

## 12. මාධ්‍යවේදී මොහොමඩ් රිෂ්වි මහරූෆ් අත් අඩංගුවට.

අප්‍රේල් 21 සිදු වූ අන්තවාදී ප්‍රහාරයෙන් පසු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පොලිසිය විසින් සිදු කළ සෝදිසි මෙහෙයුමක දී අනුරාධපුර මාධ්‍යවේදියකු වන මොහොමඩ් රිෂ්වි අත්අඩංගුවට ගැනීම හෙලා දකිමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් නිවේදනයක් නිකුත් කොට ඇත.

මහ්රූෆ් මහතාට අයත් ගොඩනැගිල්ලක තිබූ වීඩියෝ සහ සීඩී තැටි අතර පාස්කු ප්‍රහාරයට සම්බන්ධ තව්හීද් ජමාත් සංවිධානයේ දේශන, කථා සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය තිබේ යැයි කියමින් පොලිසිය විසින් ඔහුව මැයි 13 වැනි දින අත්අඩංගුවට ගන්නා ලදී[21]. ඉන් අනතුරුව ඔහු අධිකරණයට ඉදිරිපත් කර, තවදුරටත් රැඳවුම් භාරයේ තබා ගෙන ඇත. සතියකට ආසන්න කාලයකට පසු, එම සීඩී තැටිවල තව්හීද් ජමාත් සංවිධානයට සම්බන්ධ කිසිදු කථාවක් හෝ ප්‍රවර්ධන තොරතුරු අඩංගු නොවන බැවින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මහරූෆ් මහතාට එරෙහිව චෝදනා ගොනු නොකරන බව පොලිසිය විසින් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. පසුව මාධ්‍යවේදී මහරූෆ් මහතා ඇප මත නිදහස්

[18] https://www.tamilguardian.com/content/court-postpones-case-against-tamil-journalist

[19] Tamil guardian Tamil Guardian Mullaitivu correspondent arrested and charged 20 April 2019 https://www.tamilguardian.com/content/tamil-guardian-mullaitivu-correspondent-arrested-and-charged ( last access on 29Th June 2019)

[20] https://www.tamilguardian.com/content/human-rights-commission-investigates-navy-and-police-harassment-mullaitivu-journalist

[21] Sri Lankan Mirror. “A journalist arrested with CDs” published on 13th May 2019 https://srilankamirror.com/news/14036-a-journalist-arrested-with-cds

කර ඇත. මහරූෆ් මහතා දශක ගණනාවක් තිස්සේ රූපවාහිනි මාධ්‍යවේදියකු ලෙස, අනුරාධපුර ප්‍රදේශය කේන්ද්‍රගතව සේවය කරයි. මෙම සිද්ධිය තදින් හෙලා දකින නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ප්‍රකාශ කළේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී රාජ්‍ය ආයතන ප්‍රකාශනයේ නිදහස මාධ්‍ය නිදහස හා මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සැලකිය යුතු බවයි [22].



*මාධ්‍යවේදී රිස්වි මහරූෆ් - පින්තූරය Srilankabrief වෙබ් අඩවිය*

## 13. තිනකරන් පුවත්පතේ ජනමාධ්‍යවේදියකු අත්අඩංගුවට

ශැන්ග්‍රි-ලා හෝටලයේ මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරකරු වන සහ්රාන් හෂීම් සම්බන්ධ තොරතුරු අඩංගු පුවත්පත්වලින් කැපූ කොටස් ළඟ තබා ගෙන සිටිය දී හසු වුනැයි තිනකරන් පුවත්පතේ ජනමාධ්‍යවේදියකු අත්අඩංගුවට දින 3ක් තිස්සේ රඳවා තබා ගෙන පසුව මැයි 12 වැනි දින නිදහස් කර ඇති බවට ටැමිල් ගාඩියන් වාර්තා කරයි[23]. සිද්ධිය සිදු වූ ප්‍රදේශය ගැන තොරතුරු වාර්තා කර නැත. අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත්තේ මාධ්‍යවේදියාගේ ගමන් බෑගය පරීක්ෂා කළ අවස්ථාවේදීය.

---

[22] Srilankabrief. "FMM condemns taking journalist Mohammed Rizvi Maharoof into custody on baseless charges" published on 31st May 2019 http://srilankabrief.org/2019/05/fmm-condemns-taking-journalist-mohammed-rizvi-maharoof-into-custody-on-baseless-charges/

[23] Thinakaran journalist arrested over newspaper clippings https://www.tamilguardian.com/content/thinakaran-journalist-arrested-over-newspaper-clippings

## 14. බීබීසී මාධ්‍යවේදී අසාම් අමීන්ට එරෙහිව සමාජ මාධ්‍ය තුළ වෛරී ප්‍රකාශ




*මාධ්‍යවේදී අසාම්ට විරුද්ධව සමාජ මාධ්‍ය තුළ සන්සරණය වූ අසත්‍ය වාර්තාකරණයන් - පින්තූරය අසාම් අමීන්ගේ ෆේස්බුක් ගිණුමෙන්*

2019 අප්‍රේල් 21 වනදා රට තුළ සිදු වූ අන්තවාදී ප්‍රහාරයත් සමග සංවිධානාත්මක පිරිස් විසින් ශ්‍රී ලංකාවේ බීබීසී ජනමාධ්‍යවේදී අසාම් අමීන් ඉලක්ක කර ගනිමින් සමාජ ජාලා වෙබ් අඩවි තුළ ජාතිවාදී වෛරී ප්‍රකාශ ව්‍යාපාරයක් සිදු කරන ලදී. මෙයට පදනම් වූයේ අසාම් අමීන් සහ බීබීසී ආයතනය පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සිංහල බෞද්ධ විරෝධී පදනමකින් සහ සාවද්‍ය සහ පක්ෂපාතීභාවයකින් වාර්තාකරණයේ නියැලෙන බවට සිංහල බෞද්ධ ජාතිවාදී පිරිස් විසින් සිදු කළ චෝදනාවයි. මේ තත්වය තුළ අසාම් අමීන්ගේ ජනවර්ගය පදනම් කර ගනිමින් වෛරී ප්‍රකාශ ගණනාවක් එල්ල විය. එසේම ඔහුට සම්බන්ධයක් නොමැති සාවද්‍ය පුවත් ඔහු විසින් කළේ යැයි සඳහන් පෝස්ටු ගණනාවක් ෆේස්බුක්හි සංසරණය විය. මෙම අභූත චෝදනා ප්‍රතික්ෂේප කරමින්, තමා වාර්තා කර ඇති පුවත් සත්‍ය පුවත් බවත්, ඒවා මාධ්‍ය ආචාරධර්මවලට අනුකූලව සිදු කළ බවත් අප්‍රේල් 24 වැනි දින ෆේස්බුක්හි ඔහුගේ ගිණුමේ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරමින් ඔහු සඳහන් කර ඇත[24].

## 15. නිළි දීපානි ද සිල්වාට එරෙහිව වෛරී ප්‍රකාශ

දීපානි සිල්වා විසින් සිදු කරන ලද ප්‍රකාශයක් සාවද්‍ය ලෙස අර්ථ දක්වමින් ඇයට එරෙහිව වෛරී ප්‍රකාශ ගණනාවක් සමාජ මාධ්‍ය හරහා සංවිධානාත්මක ස්වරූපයකින් පළ විය. මැයි මස 2 වෙනිදා බත්තරමුල්ලේ දී, පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව පැවැති මාධ්‍ය හමුවක්

[24] Facebook Azzam ameens post 24th April 2019
https://www.facebook.com/AzzamAmeenSL/photos/a.1528196514153669/2006966189610030/?type=3&theater

අමතමින්, සමාජවාදී කලා සංගමය නියෝජනය කරමින් කතා කළ ජ්‍යෙෂ්ඨ රංගන ශිල්පිනියක හා සමාජ ක්‍රියාකාරිනියක වන දීපානි සිල්වා මෙසේ ප්‍රකාශයක් සිදු කරන ලදී.

> "කොයි වගේ ජනකොටස් ද මේවයෙන් නැති වෙන්නේ? මුස්ලිම් වෙන්න පුළුවන් ඒ අපේ දරුවෝ. ඔක්කොම අවු 30-20 දරුවෝ... ඇයි ඒ දරුවො නැති වෙන්නෙ. ඒ දරුවො නිකම් දරුවො ද? නෑ. හොඳ උගත් දරුවෝ. ඇත්තටම මට හිතා ගන්න බෑ ඔවුන්ගේ උගත්කම. ඔවුන් ඉංජිනේරුවෝ, ඔවුන් අයිටීවලින් උසස් තැන්වලට ගිය අය... ඔවුන් ඇයි එහෙනම් මේ වගේ දේවල්වලට පෙළඹුනේ? අන්න එතැනයි හොයන්න ඕනේ. එහෙම නම් මෙතැන කොහේ හරි වැරැද්දක් තියෙනවා. අපි ආගමට විතරක් වැරැද්ද යොමු කරලා බලන්න බෑ. අපේ පාලකයන්ගේ දේශපාලකයන්ගේ තියෙන වැරැද්ද ගැනත් අපි ඇඟිල්ල දිගු කරන්න ඕනේ. මේක ආගමික අන්තවාදී කොටස්වලින් එන දෙයක්. එහෙනම් තවදුරටත් අපට ආගම්වාදය, ජාතිවාදය අවශ්‍ය නැහැ.[25]"

මෙම ප්‍රකාශය වැරදි ලෙස අර්ථකථනය කරමින්, ඇය පාස්කු ප්‍රහාරය සාධාරණීකරණය කිරීමට උත්සාහ කරන්නේ යැයි කියමින් ඇයට විරුද්ධව වෛරී ප්‍රකාශ රාශියක් සංවිධානාත්මක ලෙස විවිධ පිරිස් විසින් එල්ල කරන ලදී.

## 16. ආගමට අපහාස කළැයි මාධ්‍ය ආයතනයේ සභාපතිට නඩු, ලේඛකයාගෙන් ප්‍රශ්න කෙරේ

බෞද්ධ තොරතුරු කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂක අගුළුගල්ලේ සිරි ජිනානන්ද හිමි විසින් කළ පැමිණිල්ලකට අනුව, දඬබ්බරයා ග්‍රන්ථය එළිදක්වන උත්සවයේ දී බුදු දහමට අපහාස වෙන කතාවක් කළේ යැයි දෙරණ මාධ්‍ය ආයතනයේ සභාපති දිලිත් ජයවීර එරෙහිව කොළඹ සංවිධානාත්මක අපරාධ නිවාරණ කොට්ඨාශය විසින් නඩු පවරා ඇති බවට වාර්තාවේ. අංක බී 12335/01/19 දරන මෙම නඩුව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ[26]මෙයට අදාළව දඬබ්බරයා ග්‍රන්ථයේ කතෘ දිල්ෂාන් පතිරත්නගෙන් ද ප්‍රකාශයක් ලබා ගෙන ඇති බව වාර්තා වේ[27]. කලම්බු ටෙලිග්‍රාෆ් වෙබ් අඩවිය වාර්තා කරන පරිදි මෙම නඩුව පවරා ඇත්තේ ද 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ප්‍රඥප්තිය පනත යටතේය[28].

---

[25]Youtube SLGear මරාගෙන මැරුණෙත් අපේ හොඳ උගත් මුස්ලිම් දරුවෝ මෙන්න විඩියෝව 3rd May 2019 https://www.youtube.com/watch?v=KCXnws6fQnk

[26]Facebook Dilshan Pathirana 19th June 2019 https://www.facebook.com/photo.php?fbid=872733926452714&set=a.160823580977089&type=3&theater

[27] Lanka Views දිලිත්ගේ ප්‍රකාශය ගැන 'දඬබ්බරයා' කර්තෘගෙන් කටඋත්තර ගනී 22th June 2019!https://www.lankaviews.com/%e0%b6%af%e0%b7%92%e0%b6%bd%e0%b7%92%e0%b6%ad%e0%b7%8a%e0%b6%9c%e0%b7%9a-%e0%b6%b4%e0%b7%8a%e2%80%8d%e0%b6%bb%e0%b6%9a%e0%b7%8f%e0%b7%81%e0%b6%ba-%e0%b6%9c%e0%b7%90%e0%b6%b1-%e0%b6%af/ (last accessed on 29th June 2019)

[28] Dilith's Speech Incurs Buddhist Monk Wrath https://www.colombotelegraph.com/index.php/diliths-speech-incurs-buddhist-monk-wrath/ published on 21st June 2019.



ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය,
කොළඹ 12,
2019.06.14

දිල්ෂාන් පතිරත්න,
දඩබ්බරයා ග්‍රන්ථ කතෘ.

<u>කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී.12335 /01/19 දරණ නඩු අංක යටතේ කරනු ලබන නියෝගයයි.</u>

කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී.12335 /01/19 දරණ නඩුවට අදාලව සංවිධානාත්මක අපරාධ නිවාරණ කොට්ඨාශය මගින් කරනු ලබන විමර් ශනයකට අදාලව දඩබ්බරයා නැමති ග්‍රන්ථය රචනා කරන ලද දිලෂාන් පතිරත්න යන අයගේ ප්‍රකාශයක් ලබා අවශ්‍ය බවට ස්ථානාධිපති සංවිධානාත්මක අපරාධ නිවාරණ කොට්ඨාසය විසින් ඉල්ලීමක් කර ඇත.

ඉහත ඉල්ලීම පරිදි දඩබ්බරයා නැමති ග්‍රන්ථය රචනා කර එය එළි දක්වන උත්සව අවස්ථාව පවත්වන ලද දිනය, ස්ථානය හා එම උත්සව අවස්ථාවට සහභාගී වූ පුද්ගයන් පිලිබඳව විස්තර සහිතව ප්‍රකාශයක් ස්ථානාධිපති සංවිධානාත්මක අපරාධ නිවාරණ කොට්ඨාසය වෙත ලබා දෙන ලෙස 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 124 වගන්තිය ප්‍රකාරව මෙයින් ඔබට නියෝග කරමි.

ප්‍රධාන මහේස්ත්‍රාත්,
ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය,
කොළඹ 12.

*කොළඹ ප්‍රධාන මහේෂ්ත්‍රාත් විසින් නියෝගය නිකුත් කරමින් එවන ලද ලිපිය- පින්තූරය ඩිල්ෂාන් පතිරත්නගෙ ෆේස්බුක් ගිණුමෙන්*

### 17. ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගැනීම

සම්මාන දිනූ ලේඛකයකු වන ශක්තික සත්කුමාර පොල්ගහවෙල පොලිසිය විසින් අප්‍රේල් 01 වැනි දින අත්අඩංගුවට ගෙන පොල්ගහවෙල මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කර රිමාන්ඩ් බන්ධනාගාර ගත කර ඇත. දැනට මාස තුනකට ආසන්න කාලයක් ඔහු මෙසේ රිමාන්ඩ් බන්ධනාගාරගත වී සිටී.

ශක්තික විසින් ලියන ලද කෙටිකථාවක් නිසා බුදු දහමට අපහාස වන්නේ යැයි ද, ජාතීන් අතර වෛරයට තුඩු දිය හැකි බව ද කියමින් බෞද්ධ තොරතුරු කේන්ද්‍රයේ අඟුලුගල්ලේ ජිනානන්ද හිමියන් විසින් පෙබරවාරි 25 වැනි දා පොලිස්පති වෙත ද, මාර්තු මාසයේ මුල තවත් භික්ෂූන් කණ්ඩායමක් විසින් ද පොල්ගහවෙල පොලිසියට ද පැමිණිලි කරන ලදී. ශක්තික අත්අඩංගුවට ගෙන ඇත්තේ 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් අන්තර්ජාතික සම්මුතිය පිළිබඳ පනත යටතේ වාර්ගික- ආගමික කණ්ඩායම් අතර ගැටුම් ඇති විය හැකි ප්‍රකාශනයක් කළේ යැයි යන වරද යටතේ ය. මෙම අත්අඩංගුවට ගැනීමට එරෙහිව ලේඛකයන්, කලාකරුවන්, මාධ්‍ය හා සිවිල් සංවිධාන සහ සාමාන්‍ය ජනතාව ගණනාවක් සිය විරෝධය පල කර තිබේ.

සාරාංශ ලෙස, මෙම කෙටිකතාවේ සඳහන් වන්නේ විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා අතරතුර උපැවිදි වන හාල්වැල්ලේ කස්සප බෞද්ධ භික්ෂුවක් කසුන් පලිහවඩන ලෙස නම වෙනස් කර, සිය බෞද්ධ භික්ෂු නේවාසිකාගාරයේ සිට වෙනත් යහළුවකුගේ නවාතැනකට යෑම පිළිබඳ කතාවකි. එහි දී එම යහළුවා විසින් තමා ලියන ලද

කෙටිකථාවක් මෙම භික්ෂුවට කියවීමට දෙන අතර, එහි සඳහන් වෙන්නේ බුදුන්ගේ ගිහිකල විවාහයේ (සිද්ධාර්ථගේ සහ යසෝදරාගේ) පුතු වන රාහුල කුමරුගේ පියා ඔහු නොවන බවයි. කසුන්ගේ ප්‍රතිචාරය වන්නේ එය ගිනි තැබීම සුදුසු බවයි. එසේම මෙම කතාවේ අග පන්සලේ ලොකු හාමුදුරුවන් සහ කස්සප අතර තිබූ ලිංගික සම්බන්ධයක් පිළිබඳව ද වක්‍රාකාරයෙන් සිහිනයක දර්ශනයක් ලෙස සඳහන් වේ. ඊට අමතරව මෙම කතාවෙන් රැඩිකල් භික්ෂු කණ්ඩායම්වල දේශපාලනයන් ගැන විවේචනයක් ද එල්ල වේ.

## 18. මාධ්‍යවේදී කුසල් පෙරේරා අත්අඩංගුවට ගැනීමට උත්සාහයක්



*මාධ්‍යවේදී කුසල් පෙරේරා - පින්තූරය Sri Lanka Mirror වෙබ් අඩවිය*

සංවිධානාත්මක අපරාධ අංශය විසින් මාධ්‍යවේදී කුසල් පෙරේරාට සහ ඔහුගේ ලිපියක් පළ කළ ඩේලි මිරර් පුවත්පතට එරෙහිව විමර්ශනයක් ආරම්භ කර ඇත. කුසල් පෙරේරා විසින් පාස්කු ප්‍රහාරයට පසු ශ්‍රී ලංකාවේ තත්වය සම්බන්ධයෙන් “From Islamic terrorism to marauding Sinhala Buddhist violence” (“ඉස්ලාමීය ත්‍රස්තවාදයෙන් කොල්ලකාරී සිංහල බෞද්ධ ප්‍රචණ්ඩත්වයට”) මැයෙන් ලියා මැයි 17 වැනි දින ඩේලි මිරර් පුවත්පතේ පළ කළ ලිපියක් නිසා ආගමික ගැටුම් ඇති වීමට හේතු වන්නේ යැයි අරුත් දක්වමින්, 2007 අංක 56 දරණ අන්තර්ජාතික සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් (ICCPR) පනත යටතේ ඔහුට විරුද්ධව මෙසේ නීති ක්‍රියාමාර්ග ගෙන ඇති බවට වාර්තා විය. එසේම මේ සම්බන්ධයෙන් ඩේලි මිරර් පුවත්පතේ කතෘ මණ්ඩල සාමාජිකයන්ගෙන් පොලිසිය ප්‍රශ්න කරන ලදී[29].

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මේ පිළිබඳව නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ මෙය මාධ්‍යයේ සහ ප්‍රකාශනයේ නිදහස සම්බන්ධයෙන් බරපතල තර්ජනයක් වන බවත්, මෙම

[29] https://www.srilankamirror.com/news/14490-senior-journalist-kusal-perera-under-threat

පනත යටතේ නීති ක්‍රියාමාර්ග ඇප ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට බවත්, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකු විසින් පුවත්පත් මාධ්‍යයට ලියන ලද ලිපියක් සම්බන්ධයෙන් මෙවැනි පියවරක් ගැනීම නරක පූර්වාදර්ශයක් බවත්ය[30].

මාධ්‍ය සංවිධානවලින් සහ සිවිල් සංවිධානවලින් පැමිණි බරපතල විරෝධය හමුවේ මෙම පරීක්ෂණය නවතා දැමීමට රජය විසින් කටයුතු කරන ලදී. පෙරේරා ජනපතිවරයා සමග පැවැත්වූ පෞද්ගලික සාකච්ඡාවක දී ඔහු අත්අඩංගුවට නොගන්නා බවට ජනපති විසින් පොරොන්දු වූයේ යැයි පෙරේරා විසින් ජුනි 15 දා නිකුත් කළ ට්විටර් පණිවුඩයක සඳහන් විය[31]. පසුව මේ සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකමක් පෙත්සමක් ද පෙරේරා විසින් පවරන ලදී[32].

---

30 http://srilankabrief.org/2019/06/sri-lanka-fmm-condemns-the-attempts-to-suppress-journalists-and-media-using-the-iccpr-act/

31 Kusal Perera Tweet on 15 June 2019 10.29 pm https://twitter.com/Cokroach/status/1140129143809437697

32 http://www.dailynews.lk/2019/07/08/law-order/190543/fr-filed-senior-journalist-kusal-perera-fixed-support

# C. මර්දනකාරී නීති

## 19. ICCPR පනත ප්‍රකාශනයේ නිදහස මර්දනයට යොදා ගැනීම.

පසු ගිය මාස තුන ඇතුළත, අයි.සී.සී.පී.ආර්. පනත හෙවත් 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත ප්‍රකාශනයේ සහ භාෂණයේ නිදහස මර්දනය කිරීමට දැඩි ලෙස අවභාවිතා කරනු ලැබුණි.

ජනමාධ්‍යවේදී කුසල් පෙරේරා අත්අඩංගුවට ගැනීමට කළ උත්සාහය සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් නිකුත් කළ ලිපියේ මෙම ප්‍රවණතාවය ගැන සඳහන් කරමින් එය දැඩි ලෙස හෙළා දැක තිබුනි. එසේම අප්‍රේල් මාසය මුල ශක්තික සත්කුමාර මෙම පනත යටතේ අත්අඩංගුවට ගෙන අත්තනෝමතික ලෙස ඇප නොදී තවමත් රඳවා තබා ගැනීම ඉතා නරක පූර්වාදර්ශයක් විය. එසේම දෙරණ මාධ්‍ය ආයතනයේ සභාපති දිලිත් ජයවීරට විරුද්ධව නඩු පවරා ඇත්තේ ද මෙම පනත යොදා ගෙන බවට කලම්බු ටෙලිග්‍රාෆ් වෙබ් අඩවිය වාර්තා කර ඇත. තවත් සිද්ධියක දී නැව් සුක්කානමක රූප සහිත ඇඳුමක් හැඳ සිටි අබ්දුල් රහීම් මාෂිනා නම් කාන්තාවක් ධර්ම චක්‍රය දැක්වෙන ඇඳුමක් හැඳ බුද්ධාගමට අපහාස කළේ යැයි මෙම පනත යටතේම අත්අඩංගුවට ගෙන ඇප නොදී අත්තනෝමතික ලෙස රැඳවුම් භාරයේ තබා ගෙන සිටී[33]. මේ සම්බන්ධයෙන් එම කාන්තාව මූලික අයිතිවාසිකම් නඩුවක් ද පවරා ඇත.

## 20. හදිසි නීතිය පැනවීම සහ අයිතිවාසිකම් සීමා වීම

අප්‍රේල් 21 සිදු වූ අන්තවාදී බෝම්බ ප්‍රහාරයෙන් පසු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් රට තුළ වහාම ක්‍රියාත්මක වන පරිදි හදිසි නීතිය ක්‍රියාත්මක කරන ලද අතර, එය පාර්ලිමේන්තුව හරහා මාසයෙන් මාසය දිගු කරමින් තවදුරටත් අඛණ්ඩව පවත්වා ගෙන යයි. ජූනි මස 22 සිට හදිසි නීතිය තවත් මසකින් බලාත්මක කර ඇත[34].

දැනට බලාත්මක වී පවතින හදිසි නීතිය යටතේ ප්‍රකාශනයේ නිදහස, රැස්වීමේ නිදහස, වෘත්තීය ක්‍රියාමාර්ග සහ වැඩ වර්ජන සිදු කිරීමේ නිදහස බරපතල සීමාවන්ට ලක් කර ඇත. හදිසි නීති රෙගුලාසි යටතේ 'ත්‍රස්තවාදී ක්‍රියා' යන නිර්වචනය තුළ 'අත්‍යවශ්‍ය සේවාවන් හෝ සැපයීම්වලට බරපතල බාධා හෝ හානි සිදුකිරීම' ඇතුළත් වේ. මෙම අත්‍යවශ්‍ය සේවා යන අර්ථකථනයට කම්කරු රැස්වීම්, උද්ඝෝෂණ ව්‍යාපාර යන සියල්ල රාජ්‍ය විරෝධී මෙන්ම ත්‍රස්තවාදී ක්‍රියා ලෙස නිර්වචනය කිරීමේ අවදානමක් පවතී. අත්‍යවශ්‍ය සේවා අතරට ප්‍රවාහන සේවා, විදුලිබලය, ඛනිජ තෙල්, තැපැල් හා විදුලි සංදේශ සේවා, ගුවන් විදුලි සහ රූපවාහිනී සේවා, සියලු රජයේ සේවා, තේ, පොල්, රබර් වගාවන්ට අදාළ සේවා, ඇඟළුම් කර්මාන්තයට අදාළ සේවා ඇතුළුව තවත් ගණනාවක් අඩංගු වේ. අත්‍යවශ්‍ය සේවාවලට අදාළ කටයුතුවල නොයෙදීම පැහැරහැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම වැඩවර්ජනයකට හෝ වෙනත් සංවිධානාත්මක ක්‍රියාවකට අනුබල දීමෙන් වරදකරුවන් වන තැනැත්තන්ට වුවද සේවය අහිමි කිරීමේ අත්අඩංගුවට ගැනීමේ ප්‍රතිපාදන හදිසි නීතිය තුළ පවතී. එසේම ඕනෑම මාධ්‍ය ආයතනයක් වසා දැමීමේ, අවහිර කිරීමේ,

---

[33] http://www.dailynews.lk/2019/06/15/law-order/188463/detained-woman-files-fr-plaint
[34] Hiru news emergency regulations extended by another month 22nd June 2019 http://www.hirunews.lk/218867/emergency-regulations-extended-by-another-month (last access on 29th June 2019)

ජනමාධ්‍ය සීමා කිරීමේ බලතල පවතී. එසේම සැකපිට අත්අඩංගුවට ගන්නා කෙනෙක් මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමෙන් තොරව දින 30ක් දක්වා රඳවා තබා ගත හැකිය. ආරක්ෂක ලේකම්වරයාගේ නියෝගය පරිදි පුද්ගලයකු වසරක් දක්වා රඳවා තබා ගත හැකිය. එසේම පොලිසියට ලබා දෙන ලද පාපොච්චාරණ මත පදනම් වෙමින් දඬුවම් ලබා දීමේ හැකියාව හදිසි නීතිය තුළ ඇත. එබැවින් පුද්ගලයන් වද හිංසාවට ලක් වීමේ බරපතල අවදානමක් ද හදිසි නීතිය ක්‍රියාත්මක වීමේ දී පවතී.

## 21. ප්‍රතිත්‍රස්ත පනත නැවත ගෙන ඒමේ උත්සාහයක්

පාස්කු ප්‍රහාරයට පසුව කලින් මතභේදයට ලක් වූ ප්‍රතිත්‍රස්ත පනත නැවත ගෙන ඒමට අවශ්‍ය යැයි රජය මතු කර සිටී. අප්‍රේල් 28 වැනි දින විශේෂ ප්‍රකාශයක් නිකුත් කරමින් අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රතිත්‍රස්ත පනත ගෙන ආ යුතු බව ප්‍රකාශ කළේය[35]. එසේම නැවතත් පසුගිය මැයි 8 වැනි දින එම පනත ඉක්මනින් සම්මත කර ගැනීමට සහාය වෙන්නැයි පාර්ලිමේන්තුවෙන් ද ඉල්ලා සිටියේ ය. ඔහු ඉදිරිපත් කළ තර්කය වූයේ ගෝලීය ත්‍රස්තවාදය සමග කටයුතු කිරීමට දැනට පවතින නීති ප්‍රමාණවත් නොවේය යන්නයි.

එහිදී මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළ විපක්ෂ නායක රාජපක්ෂ සඳහන් කළේ මෙය එවැනි පනතක් සම්මත කිරීම සඳහා සුදුසු අවස්ථාව නොවන බවයි. එසේම ඒ ගැන අදහස් දැක් වූ ජවිපෙ පක්ෂ නායක අනුර දිසානායක මහතා විසින් ද මතු කළේ ජනතා අරගල මර්දනය කිරීමට පාවිච්චි කළ හැකි මෙවැනි පනතක් කවර තත්වය යටතේ වුවද සම්මත නොවිය යුතු බව තම පක්ෂයේ ස්ථාවරය බවයි. එසේම පා.ම. චන්දිම වීරක්කොඩි විසින් මතු කළේ ආංශික අධීක්ෂණ කමිටුව ඉදිරියේ පොලිස් නිලධාරීන්, රහස් පොලිසියේ අධ්‍යක්ෂක, ත්‍රස්ත විමර්ශන අංශයේ අධ්‍යක්ෂක, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා, සහ නීතිපති විසින් ද පෙන්වා දී ඇත්තේ ත්‍රස්තවාදය මර්දනය කිරීමට ප්‍රතිත්‍රස්ත පනතේ අවශ්‍යතාවක් නො පවතින බවයි.

2018 වසරේ සැප්තැම්බර් මාසයේ දී ගැසට් කළ මෙම පනත සමාජ ක්‍රියාකාරීන්ගේ, සිවිල් සංවිධාන, වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂ ගණනාවක දැඩි විවේචනයට ලක් වූ එකකි. රජය පවසන ආකාරයට මෙම පනත ගෙන ඒමට සූදානම් වන්නේ දැනට බලාත්මකව පවතින 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරමිනි. පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ද දැඩි සේ අවභාවිතා කරමින් අත්තනෝමතික ලෙස පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්, රඳවා ගැනීම්, වදහිංසාවට පාත්‍ර කිරීම්, සහ ජනමාධ්‍යවේදීන්, සමාජ ක්‍රියාකාරිකයන් මර්දනය කිරීම සම්බන්ධ සිදු වීම් ගණනාවක් සිදු වී ඇත. නිලධාරීන්ට වැඩි බලතල ලබා දෙන යෝජිත ප්‍රතිත්‍රස්ත පනත තුළින් මීට වඩා සමාජ මර්දනයක් සිදු විය හැකි බව නීතිඥ සංවිධාන ජාතික එකමුතුව, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වැනි සිවිල් සංවිධාන ගණනාවක් අදහස් ප්‍රකාශ කොට ඇත.

[35] http://www.pmoffice.gov.lk/download/press/D00000000080_EN.pdf

# D. වෙනත්

## 22. යාපනය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමයේ සභාපති හා ලේකම් පොලිස් අත්අඩංගුවට

යාපනය විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති හා ලේකම් පොලීසිය විසින් මැයි මස 3 වන දින අත්අඩංගුවට ගන්නා ලදී. එදින උදෑසන 4ට පමණ පොලීසිය විසින් විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරයේ සිදු කරන ලද සෝදිසි මෙහෙයුමකදී යාපනයේ විශ්වවිද්‍යාලයේ සභාපති හා ලේකම් රැඳී සිටි කාමරයේ තිබී දුරදක්නයක් , බූට් සපත්තු කුට්ටමක් සහ මියගිය එල්.ටී.ටී.ඊ නායක ප්‍රභාකරන්ගේ පෝස්ටරයක් හමුවීම හේතුවෙන් ඔවුන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇති බව වාර්තා වේ [36]. මොවුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිසුන් දෙදෙනා රඳවා තබා විමර්ශනය කිරීමට අවසර ඉල්ලා ශ්‍රී ලංකා පොලිසිය ආරක්ෂක අමාත්‍යාංශයට ඉල්ලීමක් කර ඇති බව ටැමිල් ගාර්ඩියන්ස් වෙබ් අඩවිය සඳහන් කරයි[37].

2019 මාර්තු මාසයේ දී යාපනය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් සහ අතුරුදහන් වූ පවුල් සමග එකතු වී දෙමළ ජනයා සමූහ ඝාතනය කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික අපරාධ අධිකරණයෙන් පියවර ගන්නා ලෙස ද, දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස ද ඉල්ලමින් උද්ඝෝෂණය කර ඇත[38]. මෙම අත්අඩංගුවට ගැනීම්වලින් පසුව ටැමිල් ගාඩියන් වෙත අදහස් දැක්වූ මුලතිවු හි අතුරුදහන් වූ පවුල් සංවිධානය විසින් කියා තිබුනේ මෙම ශිෂ්‍යයන් මාස කිහිපයකට පෙර දේශපාලන සිරකරුවන්ගේ නිදහස වෙනුවෙන් සටන් කළ බවත්, මෙලෙස හදිසි නීතිය යටතේ මොවුන් අත්අඩංගුවට ගන්නේ නම්, සමාන ගැටළු සම්බන්ධයෙන් හඬ නැගූ තමන් ඇතුළු අනෙකුත් ක්‍රියාකාරීන් ද හදිසි නීතිය යටතේ අත්අඩංගුවට පත්වීමට අවදානමක් ඇති බවයි. මෙම ශිෂ්‍යයන් ඇප මත නිදහස් කර ඇති බව මැයි 16 වෙනි දා ඩේලිනිව්ස් පුවත්පත වාර්තා කර ඇත[39].

## 23. මහානායක හිමිගේ වෛරී ප්‍රකාශ ගැන පැමිණිලි කළා යැයි සිවිල් ක්‍රියාකාරිකයාට එරෙහි පලිගැනීම්

වෛරී ප්‍රකාශයක් සිදු කළ මහානායක භික්ෂුවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස පැමිණිල්ලක් සිදු කළ මානව හිමිකම් ක්‍රියාධර, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂක පාක්‍යසෝති සරවණමුත්තු මහතාට බෞද්ධ භික්ෂූන් සහ වාර්ගික-ජාතිකවාදී කණ්ඩායම්වල පලි ලක්වීමට සිදු වී ඇත.

---

[36] "Jaffna Uni Students Union President, secretary arrested with Prabha posters" 4th May 2019, Daily Mirror (last accessed on 29th June 2019) http://www.dailymirror.lk/front_page/Jaffna-Uni-Students-Union-President--secretary-arrested-with-Prabha-posters/238-166440

[37] "Sri Lankan police seek PTA powers for arrested students" 4th May 2019, Tamil Guardian. (last accessed on 29th June 2019) https://www.tamilguardian.com/content/sri-lankan-police-seek-pta-powers-arrested-students

[38] "Jaffna uni students demand Sri Lanka be referred to ICC for genocide".22nd March 2019. Tamil Guardian. https://www.tamilguardian.com/content/jaffna-uni-students-demand-sri-lanka-be-referred-icc-genocide

[39] "Jaffna University students' union president and secretary released on bail". 16th May 2019, Daily News. (Last accessed on 5th July, 2019) http://www.dailynews.lk/2019/05/16/law-order/185803/jaffna-university-students'-union-president-and-secretary-released-bail

'අන්තවාදී ප්‍රකාශ සිදු කිරීම' සම්බන්ධයෙන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් අන්තර්ජාතික සම්මුතිය යටතේ නඩු පවරන ලෙස ඉල්ලා බෞද්ධ ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ජුනි 27 හෝ ඊට ආසන්න දිනයක දී කොළඹ පොලිස් මූලස්ථානය වෙත පැමිණිල්ලක් සිදු කර ඇත. සරවණමුත්තු මහතාට විරුද්ධව පැමිණිල්ල කළ අවස්ථාවේ මාධ්‍යයට අදහස් දැක්වූ බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානයේ අඟුළුගල්ලේ ජිනානන්ද හිමි මෙසේ කියා සිටියේය. "ජනාධිපතිවරයාටත්, බලධාරීන්ටත් සිහිපත් කරනවා. මේ එන්ජීඕ කල්ලි වහාම තහනම් කරලා, පිටරට සල්ලිවලින් මේ රට වනසන්න හදන මේ පිරිස් මේ රටින් පන්නලා දමන්න ඕනේ. ඒ වගේම පාක්‍යසෝති සරවණමුත්තු පතුරන මේ අන්තවාදී ජාතිවාදී ප්‍රකාශවලට එරෙහිව 2007 අංක 56 දරන පනත යටතේ නඩු පවරලා ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන ලෙස අපි පොලිස්පතිවරයාට කරණු සහිත පැමිණිල්ලක් අද ඉදිරිපත් කරන්න යෙදුණා" [40] මේ ගැන අදහස් දැක් වූ සිහල රාවය නම් රැඩිකල් බෞද්ධ සංවිධානයේ සභාපති, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අක්මීමන දයාරතන හිමියන් කීවේ මීට පෙර කිසිවකු විසින් මහානායක හිමිවරුන්ට අභියෝග කර නොමැති බවත්, මේ ක්‍රියාව දකින්නේ ජාත්‍යන්තරය විසින් සිදු කරන අභියෝගයක් ලෙස බවත්ය. තවදුරටත් මේ නිසා සරවණමුත්තු මහතා සමාජ මාධ්‍ය ජාලා තුළ වෛරී ප්‍රකාශවලට ඉලක්ක විය.

මෙම පළිගැනීම්වලට හේතු වූයේ පාක්‍යසෝති සරවණමුත්තු මහතා විසින් අස්ගිරි පාර්ශවයේ මහානායක අතිගරු වරකාගොඩ ශ්‍රී ඥානරතන භික්ෂුව විසින් සිදු කළ ප්‍රසිද්ධ ප්‍රකාශයක් සම්බන්ධයෙන් කළ පැමිණිල්ලක් නිසාය. සිංහල බෞද්ධ ජනතාවට මුස්ලිම් කඩවලට නොයන ලෙසත්, එවැනි මුස්ලිම් කඩවලට යන සිංහල පාරිභෝගිකයන් වඳභාවයට පත් විය හැකි බවටත්, සිංහල කාන්තාවන්ට වඳ සැත්කම් සිදු කළේ යැයි චෝදනා එල්ල වී ඇති වෛද්‍යවරයකුට ගල් ගැසිය යුතු යැයි ද උන්වහන්සේ ප්‍රකාශ කළහ. මේ ප්‍රකාශයට විරුද්ධව අදාළ බලධාරීන් විසින් කිසිදු පියවරක් නොගත් සන්දර්භය තුළ සරවණමුත්තු මහතා මෙම පැමිණිල්ල කරන ලදී.

මහානායක භික්ෂුව විසින් කරන ලද ප්‍රකාශය කුරුණෑගල රජයේ රෝහලක සේවයේ නියුතු ශාෆි ශහබ්දීන් නම් මුස්ලිම් වෛද්‍යවරයකු සම්බන්ධ සිද්ධියක් හා සම්බන්ධය. සිංහල කාන්තාවන් වඳභාවයට පත් කළේ යැයි ඔහුට එල්ල වූ චෝදනා වාර්ගික ලෙස ඉලක්ක කළ චෝදනා විය. මෙම සිද්ධියේ දී, වෛද්‍යවරයා විසින් ඔහු විසින් සිදු කරන සිසේරියන් සැත්කම් අතරතුර කාන්තාවන්ගේ කැමැත්ත නොවිමසා වඳභාවයට පත් කළේ යැයි ජාතිකවාදී පුවත්පතක් විසින් පළ කළ පුවතක් පදනම් කර ගෙන ඔහු අත්අඩංගුවට ගනු ලැබිණි. එසේම ඔහුට විරුද්ධව සැකසහිත හෝ නීතිවිරෝධී ආකාරවලින් මුදල් ඉපැයුවේ යැයි චෝදනා ද එල්ල විය. පරීක්ෂණවලින් පසුව මෙම චෝදනා සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් නොමැති බව අපරාධ පරීක්ෂණ අංශය උසාවියට දැනුම් දෙන ලදී[41].

---

[40] අන්තවාදී ප්‍රකාශයන්ට එරෙහිව පාක්‍යසෝති සරවනමුත්තුට එරෙහිව පැමිණිල්ලක්... https://youtu.be/AMA1nbeN68M

[41] CID informs Court no evidence found for all allegations against Dr. Shafi Shihabdeen http://www.ft.lk/front-page/CID-informs-Court-no-evidence-found-for-all-allegations-against-Dr--Shafi-Shihabdeen/44-680838 accessed on 20th August 2019

## 24. වාර්ගිකව පක්ෂපාතී ලෙස පරීක්ෂණ නොකැළැයි පොලිස් නිලධාරියාට පා.ම. හිමිනමකගෙන් උසාවියේ දී තර්ජන

අපරාධ පරීක්ෂණ අංශයේ (CID) පොලිස් නිලධාරියකුට මහේස්ත්‍රාත් අධිකරණයේ දී බෞද්ධ භික්ෂුවක් මෙන්ම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන අතුරලියේ රතන හිමි විසින් තර්ජනය කර තිබුනේ මුස්ලිම් වෛද්‍යවරයකුට එරෙහිව වාර්ගික ලෙස අගතියක් වන පරිදි චෝදනා ගොනු කිරීමට කටයුතු කළ බැවිනි. [මෙම සිද්ධිය ඉහත පෙර සිද්ධියේ අවසන් ඡේදයේ සඳහන් එකම සිද්ධියයි]. ජුනි 27 වැනිදා, රහස් පොලිසිය විසින් සහාය පොලිස් අධිකාරී බී.එස්. තිසේරා මහතා වෛද්‍ය ශාෆි ෂහබ්දීන් සම්බන්ධයෙන් උසාවියට තොරතුරු ඉදිරිපත් කිරීමට පැමිණි අවස්ථාවේ, විවේක කාලය අතරතුර පා.ම. අතුරලියේ රතන හිමි ඔහු වෙත පැමිණ, වාර්තා වෙන පරිදි ඔහුගේ උරහිසට තට්ටු කර ඇත. තිසේරා හිමි නමට සුබ පැතූ අවස්ථාවේ දී වාර්තා වෙන පරිදි නිලධාරියා වෙත ඇඟිල්ල උරුක් කර, භික්ෂුව විසින් මෙසේ කියා ඇත. “අපි බලාගමු. ලෝකයම මේක බලන් ඉන්නවනේ.” භික්ෂුව මේ ප්‍රකාශය කර ඇත්තේ ජුනි 27 වැනිදා විවෘත උසාවියේ දීය. තවදුරටත් උසාවියෙන් පිටත ද සහාය පොලිස් අධිකාරී තිසේරා මහතාට එරෙහිව වෙනත් නින්දා අපහාස සිදුවන අදහස් ද ඉදිරිපත් කර ඇත. රහස් පොලිසිය මේ සම්බන්ධයෙන් භික්ෂුවගේ ප්‍රකාශ සම්බන්ධයෙන් රූපවාහිනී නාලිකා දෙකකින් සංස්කරණය නොකළ දර්ශන ලබා ගැනීමට නියෝග ලබා ගෙන ඇත. මෙම කරුණු ඊළග නඩුවාරයේ දී මහේස්ත්‍රාත්වරයාට වාර්තා කරන ලදී[42].

## 25. සරණාගතයන්, සහ සරණාගතයන්ට සහාය දෙන මානව හිමිකම් ක්‍රියාධරයන් සහ සංවිධාන මුහුණ පෑ ගැටළු

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසුව, රජය සහ එක්සත් ජාතීන්ගේ සරණාගත මහලේකම් කාර්යාලය (UNHCR) අවබෝධතා ගිවිසුමක් මත ශ්‍රී ලංකාවේ සිටින සරණාගතයන් සහ රැකවරණ පතන්නන් 1000කට වැඩි පිරිසක් ඔවුන්ගේ නිවෙස් සහ කාමරවලින් බලෙන් එළියට දමන ලද අතර, සමහරෙකුට තර්ජන සහ කායික ප්‍රචණ්ඩත්වයට ද මුහුණ පෑමට සිදු විය. ඉන්ෆෝම් නිරීක්ෂණය කළේ ඔවුන්ව වියහැකි ත්‍රස්ත සැකකරුවන් ලෙස චිත්‍රණය කිරීමට උත්සාහ කිරීමේ සාමාන්‍ය රටාවක් තිබුනි. මේ සන්දර්භය තුළ සරණාගතයන්ට උදව් කිරීමට සහ ඔවුන් ආරක්ෂා කිරීමට පැමිණි මානව හිමිකම් ක්‍රියාධරයන් සහ සංවිධානවලට පහර දීම්, පහර දෙන බවට තර්ජන, කාර්යාල වටලෑම සහ කාර්යාල ඉදිරියේ විරෝධතා ඇතුළු විවිධ හිරිහැරවලට, බිය ගැන්වීම්වලට ලක් වීමට සිදු විය.

[42] CID under siege http://www.sundayobserver.lk/2019/08/04/news-features/cid-under-siege